ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2026.07.16

| | | |
|---|---|---|
| පැමිණිලි පාර්ශවය | : | ජී.එච්.ඩී.එච්.ලෝගුස් මිය<br>නො 56, හේකිත්ත පාර<br>වත්තල. |
| වින්දිත | : | විදාන පතිරණලාගේ සත්සිදු ඉදුරංග |
| වගඋත්තර පාර්ශවය | : | 1) එෆ්.එස්.විජේසිංහ මිය<br>විදුහල්පති<br>ශාන්ත අන්තෝනි විද්‍යාලය<br>වත්තල.<br><br>2) කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ<br>කලාප අධ්‍යාපන කාර්යාලය<br>කැලණිය.<br><br>3) ස්ථානාධිපති<br>පොලිස් ස්ථානය<br>වත්තල. |

**පැමිණිලි අංකය : HRC/3809/24**

**පැමිණිල්ල**

බප/කැල/ශාන්ත අන්තෝනි විද්‍යාලයේ ඉගෙනුම ලැබූ තම දරුවාට පාසලේදී වූ සිද්ධියක් පාදක කර ගනිමින්, එකී ශිෂ්‍යයාගේ මව වන පැමිණිලිකාරිය විසින් 2024.09.20 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත මෙම පැමිණිල්ල ඉදිරිපත් කර ඇත.

එම පැමිණිලි වාර්තාවට අනුව සිද්ධිය සැකෙවින් මෙසේය,



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක. 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு - 04. / No. 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පැමිණිලිකාරිය ප්‍රකාශ කරන පරිදි වත්තල ශාන්ත අන්තෝනි ජාතික පාසලේ 10-B ශ්‍රේණියේ ඉගෙනුම ලබමින් සිටි වී.පී. සත්සිඳු ඉඳුරංග නැමැති තම දරුවා සුපුරුදු පරිදි 2024.09.12 වන දින පාසල් පරිශ්‍රය වෙත පැමිණ තිබේ. එදින ද සිරිත් පරිදි පාසල් ශිෂ්‍ය නායක මණ්ඩලය විසින් සිසුන්ගේ පාසල් බෑගයන් පරීක්ෂාවට ලක් කර ඇත. එහිදී උප ප්‍රධාන ශිෂ්‍ය නායක 'එස්බොන්' නමැති සිසුවා තම පුතාගේ බෑගය පරීක්ෂා කරන මුවාවෙන් ක්‍රියා කර ඔහු සන්තකයේ සඟවාගෙන සිටි දුම්කුඩු පැකට්ටුවක් තම පුතාගේ බෑගය තුළට දමා, පසුව එය නැවත බෑගයෙන් ඉවතට ගෙන තම පුතාට ව්‍යාජ චෝදනා එල්ල කරමින් ඔහුගේ කණ ප්‍රදේශයට අතින් පහර දී ඉන් අනතුරුව එකී දුම්කුඩු පැකට්ටුව වලකුඹුර නැමැති නියෝජ්‍ය විදුහල්පතිවරයා වෙත ඉදිරිපත් කර තිබේ.

පැමිණිලිකාරිය පවසන පරිදි ඇය විසින් පසුව සිදු කරන ලද ස්වාධීන කරුණු සෙවීමේදී ඇය හට අනාවරණය වී ඇත්තේ, මෙම දුම්කුඩු පැකට්ටුව 12 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන 'කවිෂ්ක අංජුල' නැමැති සිසුවෙකු විසින් උප ප්‍රධාන ශිෂ්‍ය නායක එස්බෝන් සිසුවා වෙත ලබා දී ඇති බවයි. ඒ අනුව, එකී සිසුවාගේ අනුදැනුම හා අනුබලදීම මත, තම දරුවා සාවද්‍ය ලෙස වරදකරු කිරීමේ චේතනාවෙන් මෙම කුමන්ත්‍රණකාරී ක්‍රියාව ඔවුන් විසින් සිදු කර ඇති බවට පැමිණිල්ල මගින් වැඩිදුරටත් සාක්ෂි සහිතව කරුණු ගොනු කර ඇත.

පැමිණිලිකාරිය පවසන පරිදි ඉන්පසුව විදුහල්පතිනිය විසින් වින්දිත ශිෂ්‍යයාගේ පියාට (පැමිණිලිකාරියගේ ස්වාමිපුරුෂයාට) වහාම පාසල් පරිශ්‍රය වෙත පැමිණෙන ලෙස දන්වා ඇත. එහෙත්, එම අවස්ථාව වන විට පැමිණිලිකාරිය හෘදයාබාධයක් හේතුවෙන් කොළඹ ජාතික රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබමින් සිටි බැවින් සහ ඇයගේ ස්වාමිපුරුෂයාට සිය සේවා ස්ථානයෙන් ක්ෂණිකව බැහැරව පැමිණීමට අපහසුතා පැන නැගී තිබූ බැවින්, ඔහු විසින් තම බිරිඳගේ සහෝදරිය (වින්දිත සිසුවාගේ සුළු මව/පුංචි අම්මා) අමතා පාසල වෙත යන ලෙස උපදෙස් දී ඇති අතර ඒ අනුව ඇය පාසල වෙත ගොස් ඇත. පැමිණිලිකාරිය පවසන පරිදි එම අවස්ථාවේ දී විදුහල්පතිනිය විසින්, පැමිණිලිකාරියගේ සහෝදරිය වෙත ප්‍රකාශ කර ඇත්තේ සත්සිඳු ඉඳුරංග නැමැති සිසුවා විසින් පාසල තුළට 'කුඩු' (මත්ද්‍රව්‍ය) රැගෙන ආ බවටය. කෙසේ වුවද, පසුව ඇය එය 'දුම්කුඩු' වශයෙන් සංශෝධනය කරමින් ප්‍රකාශ කරන ලද බවද කියා සිටී. තවද, මෙම සිදුවීමට අදාළව විනය පියවරක් වශයෙන් 2024.09.12 දින සිට 2024.09.25 වන දින දක්වා කාල සීමාව තුළ තම දරුවාගේ පාසල් පැමිණීම තාවකාලිකව අත්හිටුවීමට තීරණය කර ඇති බව විදුහල්පතිනිය විසින් එම අවස්ථාවේ පැමිණිලිකාරියගේ නැගණියට දන්වා ඇති බවට පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටී.

ඉන් අනතුරුව විදුහල්පතිනිය විසින් පැමිණිලිකාරියගේ සහෝදරිය වෙත එදින ලිපියක් භාර දී ඇති බවත් එම ලිපියෙහි සත්සිඳු ඉඳුරංග නැමැති ශිෂ්‍යයා (වින්දිත සිසුවා) පාසල් පරිශ්‍රය තුළට මත්ද්‍රව්‍ය රැගෙන එන බවටත්, ඒවා භාවිතා කරන බවටත් ප්‍රමාණවත් සාක්ෂි ලැබී ඇති බව විදුහල්පතිනිය විසින් සඳහන් කර තිබූ බවත්, ඒ අනුව ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසට වත්තල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා වෙත එම ලිපිය මගින් දන්වා තිබූ බවටත්, එකී ලිපියේ පිටපතක් ද සහිතව පැමිණිලි පාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත කරුණු දක්වා ඇත. එකී ලිපිය ද සමගින් වින්දිත සිසුවාව වහාම වත්තල පොලිස් ස්ථානය වෙත රැගෙන යන ලෙසට විදුහල්පතිනිය විසින් පැමිණිලිකාරියගේ සහෝදරියට එම අවස්ථාවේ නියෝග කර ඇතත්, පැන නැගී ඇති තත්ත්වයේ අසාධාරණභාවය හේතුවෙන් තම නැගණිය දරුවා සමඟ පොලිස් ස්ථානය වෙත නොගොස් නැවත නිවස බලා පැමිණ ඇති බවට පැමිණිලිකාරිය සිය පැමිණිල්ල මගින් වැඩිදුරටත් කියා සිටී.

පැමිණිලිකාරිය පවසන පරිදි ඉන් අනතුරුව 2024.09.13 වන දින තමා රෝහල්ගතව ප්‍රතිකාර ලබා නිවස බලා පැමිණි බවත්, එහිදී පාසල් බලධාරීන් විසින් නිකුත් කරන ලද ඉහත කී 2024.09.12 ලිපිය ප්‍රකාරව පොලිස් ස්ථානය වෙත යාමට ප්‍රථම, ඇය තම දරුවා ද කැටුව පාසලේ විදුහල්පතිනිය හමුවීමට ගොස් ඇත. එම අවස්ථාවේදී විදුහල්පතිනිය ඉතා දැඩි ස්වරයෙන් ඔවුන් පාසල වෙත පැමිණි හේතුව ප්‍රශ්න කරන ලද බවත්, "***ඔයාලාට ලියුමක් දුන්නේ පොලිස් ස්ථානයට යන්න කියලානේද?***" යනුවෙන් පවසමින් තමා සහ තම දරුවාව අසීරුතාවයට පත් කර ඇති බවටත් කරුණු දක්වා ඇත. පැමිණිලිකාරිය පවසන පරිදි එම අවස්ථාවේදී, තම දරුවාගේ බෑගය තුළ තිබී සොයාගත් ද්‍රව්‍යයන් මොනවාදැයි පැමිණිලිකාරිය විසින් විදුහල්පතිනියගෙන් විමසා සිටි විට, විදුහල්පතිනිය විසින් එය 'කුඩු පාර්සලයක්' ලෙස හඳුන්වා දී තිබේ. තවද, "***තමුසෙගේ පුතා මත්ද්‍රව්‍ය පාසලට ගෙනල්ලා, ඒවා බොනකොට තමයි අහුවුනේ, තමුසෙලා දරුවා අතේ මත්ද්‍රව්‍ය එවලා ඒවා විකුණලාද ජීවත් වන්නේ***" යැයි පවසමින්, "***යනවා තමුසෙලා ගිහින් පොලිසියෙන් බේරගන්නවා***" යනුවෙන් පවසමින් අවමන්සහගත අයුරින් බැන වැදී ඇත. එසේම, විදුහල්පතිනිය විසින් තම දරුවාව පුද්ගලිකව ඉලක්ක කරගනිමින් "***කුඩ්ඩා***" යන අපහාසාත්මක නාමයෙන් ආමන්ත්‍රණය කරමින් ඔහුගේ මානසිකත්වයට දැඩි ලෙස බලපෑම් එල්ල කළ බව පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටී.

මෙම සිදුවීමේ සංවේදීභාවය සලකා, සිද්ධියට අදාළ සත්‍ය අසත්‍යතාවය පිළිබඳව පාසල් මට්ටමින් අපක්ෂපාතී අභ්‍යන්තර විනය පරීක්ෂණයක් පවත්වා ගැටලුව පාසල් පරිශ්‍රය තුළදීම නිරාකරණය කරගන්නා ලෙසත්, දරුවාගේ අනාගතය සලකා ඔහුව පොලිස් ස්ථානය වෙත යොමු නොකරන ලෙසත් තමා විසින් එම අවස්ථාවේ දී විදුහල්පතිනියගෙන් බැගෑපත්ව ඉල්ලූ නමුත්, එකී සාධාරණ ආයාචනය මුළුමනින්ම නොසලකා හරිමින්, කිසිදු මූලික විමර්ශනයක් හෝ නොපවත්වා, වහාම පොලිසිය වෙත යන ලෙසට විදුහල්පතිනිය විසින් තමාට නියෝග කළ බවට පැමිණිලිකාරිය විසින් කරුණු දක්වා ඇත. තවද එදින (2024.09.13) සිට 2024.09.25 දින දක්වා කාලය තුළ තම දරුවාට පාසල් පැමිණීම තහනම් කළ බවත්, 2024.09.25 වන දින මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳව පාසලේ පැවැත්වීමට නියමිත විශේෂ චිත්‍රපට නැරඹීම සඳහා පමණක්, දරුවාගේ නීත්‍යානුකූල භාරකරුවෙකු ද සමඟින් පාසල වෙත පැමිණිය යුතු බවට විදුහල්පතිනිය විසින් අවසන් වශයෙන් නියෝග කර ඇති බවටත් පැමිණිලිකාරිය වැඩිදුරටත් කියා සිටී.

පැමිණිලිකාරිය පවසන පරිදි ඉන් අනතුරුව, ඇය තම පුතා ද කැටුව වත්තල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් වී ඇති අතර එහිදී ඇය වත්තල පොලිස් ස්ථානාධිපතිවරයා (OIC) හමු වී පාසල් බලධාරීන් විසින් නිකුත් කරන ලද ඉහත කී ලිපිය ඔහු වෙත භාර දී තිබේ. එම අවස්ථාවේදී ක්‍රියාත්මක වූ ස්ථානාධිපතිවරයා, මෙම මත්ද්‍රව්‍ය චෝදනාවට අදාළ සිදුවීම පිළිබඳව විධිමත් විමර්ශනයක් පවත්වන ලෙස මත්ද්‍රව්‍ය නිවාරණ අංශයේ උසස් නිලධාරියෙකු වෙත නියෝග කරමින් කාර්යය පවරා ඇත. එකී විමර්ශන නිලධාරියා විසින් තම දරුවාව සර්වාංග පරීක්ෂාවකට මෙන්ම පුළුල් නිරීක්ෂණයකට ලක් කරන ලද බවත්, ඉන් අනතුරුව තම දරුවා මත්ද්‍රව්‍ය භාවිතයට හෝ ඊට ඇබ්බැහි වී ඇති බවට කිසිදු සාක්ෂියක් හෝ ලක්ෂණයක් නිරීක්ෂණය නොවන බවට එම නිලධාරයා විසින් ප්‍රකාශ කරන ලද බවට පැමිණිලිකාරිය විසින් කරුණු දක්වා ඇත. කෙසේ වුවද, එකී නිලධාරියා විසින් මතු ආරක්ෂාව උදෙසා යම් හෙයකින් මත්ද්‍රව්‍ය භාවිත කරන්නේ නම් මින් ඉදිරියට එවැනි අහිතකර ක්‍රියාවලින් සම්පූර්ණයෙන්ම බැහැර වන ලෙස තම දරුවාට උපදෙස් ලබා දෙන ලද බවටත් පැමිණිලිකාරිය විසින් කරුණු දක්වා ඇත.

ඉන්පසුව, එම නිලධාරියා විසින් වින්දිත සිසුවාගේ ඡායාරූපයක් ද ලබාගෙන ඇති අතර, සවස 6.00 න් පසුව අනවශ්‍ය ලෙස නිවසින් බැහැරව නොසිටින ලෙසට දරුවාට දැඩි ලෙස අවවාද කරමින් එකී විමර්ශන කටයුත්ත එතැනින් සමාප්ත කරන ලද බවට පැමිණිලිකාරිය විසින් කරුණු දක්වා ඇත. තවද, මෙම

චෝදනාවට මුල් වූ සිදුවීම පාසල් පරිශ්‍රය තුළ හටගත් අභ්‍යන්තර ගැටලුවක් බැවින්, මේ පිළිබඳව පාසල් පාලනාධිකාරිය සමඟ සාකච්ඡා කොට ආයතනික මට්ටමින් නිරාකරණය කරගන්නා ලෙස එම පොලිස් නිලධාරියා විසින් පැමිණිලිකාරියට මඟ පෙන්වා ඇත. ඒ අනුව, පොලිස් ස්ථානය මඟින් දරුවා නිර්දෝෂී බව වක්‍රව සනාථ කිරීමෙන් අනතුරුව, තමා සිය පුතා ද සමඟ පොලිස් පරිශ්‍රයෙන් බැහැර වූ බව පැමිණිලිකාරිය සිය පැමිණිල්ල මඟින් වැඩිදුරටත් අවධාරණය කර සිටී.

පැමිණිලිකාරිය පවසන පරිදි ඉන් අනතුරුව, 'කවිෂ්ක අංජුල' නැමැති ශිෂ්‍යයා විසින් දුම්කුඩු පැකට් දෙකක් ඇයගේ දරුවාගේ බෑගය තුළට දැමීම සඳහා ඔහු විසින් ශිෂ්‍ය නායකයාට ලබා දුන් බවට සාක්ෂි දරන, එම ශිෂ්‍යයා ස්වේච්ඡාවෙන් සිදු කරන ලද ප්‍රකාශයක් අඩංගු 'හඬපටයක්' (Audio Clip) පැමිණිලිකාරිය විසින් සොයාගෙන ඇත. පැමිණිලිකාරිය පවසන පරිදි 2024.09.15 වන දින ඇය වත්තල පොලිස් ස්ථානය වෙත නැවත ගොස්, එකී ශ්‍රව්‍ය සාක්ෂිය අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර තිබේ. එම සාක්ෂියෙහි ප්‍රාථමික සත්‍යතාවය වටහාගත් අපරාධ අංශ ස්ථානාධිපතිවරයා, වහාම ක්‍රියාත්මක වී චෝදනා ලත් 'අංජුල' සහ 'එස්බොන්' යන ශිෂ්‍යයන් දුරකථනය ඔස්සේ අමතා, පසුදින එනම් 2024.09.16 වන දින පෙ.ව. 10.00 ට සිය දෙමාපියන් හෝ නීත්‍යානුකූල භාරකරුවන් ද සමඟ පොලිස් ස්ථානය වෙත වාර්තා කරන ලෙස දන්වන ලද බවට පැමිණිලිකාරිය විසින් කරුණු දක්වා ඇත.

කෙසේ වුවද, නියමිත දින පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් වූයේ චෝදනා ලත් අංජුල නැමැති ශිෂ්‍යයා සහ ඔහුගේ මව පමණක් බවත්, එම අවස්ථාවේදී විමර්ශන භාර නිලධාරී, පොලිස් පරීක්ෂක හේරත් නිලධාරියා විසින් ඉහත කී හඬපටය සැකකාර කවිෂ්ක අංජුල ශිෂ්‍යයා ඉදිරියේ අසන්නට සලස්වමින් ඔහුව ප්‍රශ්න කරන ලද බවට පැමිණිලිකාරිය විසින් කරුණු දක්වා ඇත. එහිදී, පැමිණිලිකාරියගේ පුතාගේ බෑගය තුළට සාවද්‍ය ලෙස මත්කුඩු පැකට් ඇතුළත් කිරීමේ වරද තමන් අතින් සිදු වූ බව සැකකාර අංජුල නැමැති සිසුවා විසින් පොලිස් නිලධාරීන් ඉදිරියේ පිළිගන්නා ලද බවට පැමිණිලිකාරිය විසින් කරුණු දක්වා ඇත.

පැමිණිලිකාරිය පවසන පරිදි කවිෂ්ක අංජුල ශිෂ්‍යයා විසින් පොලිසිය හමුවේ සිදු කරන ලද පාපොච්චාරණයට අනුව, ඔහු විසින් දුම්කුඩු පැකට් දෙකක් සන්තකයේ තබාගෙන පාසල් පරිශ්‍රය වෙත රැගෙන ආ බවත්, ඉන් එක් පැකට්ටුවක් උප ප්‍රධාන ශිෂ්‍ය නායක එස්බොන් සිසුවා වෙත භාර දුන් බවත් ඔහු ප්‍රකාශ කර ඇත. එසේම, එකී එස්බොන් නමැති සිසුවා විසින් සැලසුම්සහගත ලෙස එම දුම්කුඩු පැකට්ටුව වින්දිත සත්සිදු ඉදුරංගගේ බෑගයට දමන අයුරු තමා දෑසින් දුටු බව ද ඔහු තහවුරු කළ බවටද පැමිණිලිකාරිය විසින් කරුණු දක්වා ඇත. ඉන් නොනැවතී, එස්බොන් සිසුවා විසින් සත්සිදුගේ කණ ප්‍රදේශයට දැඩි ලෙස ප්‍රහාරයක් එල්ල කර, අදාළ දුම්කුඩු පැකට්ටුව 'වලකුඹුර' නැමැති නියෝජ්‍ය විදුහල්පතිවරයා වෙත භාර දුන් බවත්, එම සිදුවීම සිදුවන අවස්ථාවේදී පාසල් පරිශ්‍රයේ විශාල සිසුන් පිරිසක් මෙන්ම 10 ශ්‍රේණියේ කණිෂ්ඨ ශිෂ්‍ය නායකයින් සහ ප්‍රධාන ශිෂ්‍ය නායකයා ද සිටි බවත් සැකකාර අංජුල සිසුවා විසින් ප්‍රකාශ කර ඇත. මෙම සියලු කරුණු පාදක කරගනිමින්, තම දරුවා නිර්දෝෂී බවත්, ඔහු ද්වේෂසහගත කුමන්ත්‍රණයකට ලක්ව ඇති බවත් පැමිණිලිකාරිය සිය පැමිණිල්ල මඟින් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී.

පැමිණිලිකාරිය පවසන පරිදි එම අවස්ථාවේ පැන නැගී ඇති තත්ත්වය සලකා බලා, වත්තල පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යංශයේ උප පොලිස් පරීක්ෂකවරිය විසින් වින්දිත සත්සිදු, සැකකාර අංජුල සහ චෝදනා ලත් එස්බෝන් යන ශිෂ්‍යයන් සිය දෙමාපියන් ද සමඟින් 2024.09.18 වන දින පෙ.ව. 08:30 ට විද්‍යාලයීය පරිශ්‍රය වෙත කැඳවීමට පියවර ගෙන ඇත. එසේ වුවද, එකී නියමිත දින උප ප්‍රධාන

ශිෂ්‍ය නායක 'එස්බොන්' නමැති සිසුවා පාසල වෙත වාර්තා කිරීම සිතාමතාම පැහැර හැර ඇති බව පැමිණිල්ලේ සඳහන් වේ. තවද, ඔහු කිසිදු අවස්ථාවක පොලිස් ස්ථානය වෙත ද ඉදිරිපත් වී නොමැති බවද, තමා සතු ශිෂ්‍ය නායක ධුරය සහ ඉන් ලැබෙන වරප්‍රසාද ආරක්ෂා කරගැනීමේ අපේක්ෂාවෙන්, වින්දිත සත්සිදුගේ බෑගය තුළට සාපරාධී ලෙස දුම්කුඩු ඇතුළත් කිරීමේ වරද පිළිගැනීම ඔහු විසින් මුළුමනින්ම ප්‍රතික්ෂේප කර ඇති බවටද පැමිණිලිකාරිය විසින් කරුණු දක්වා සිටී.

එදින විදුහල්පතිනියගේ නිල කාර්යාලය වෙත තමා සහ තම පුතා කැඳවා විදුහල්පතිනිය විසින් අතිශය ප්‍රකෝපකාරී මෙන්ම ද්වේෂසහගත ස්වරූපයකින් තමන් වෙත වාචිකව දෝෂාරෝපණය කළ බවට පැමිණිලිකාරිය විසින් කරුණු දක්වා ඇත. ඉන් නොනැවතී, වින්දිත ශිෂ්‍යයාගේ පාසල් අස්වීමේ ලිපියේ මෙම ව්‍යාජ චෝදනාව රතු පැනෙන් විශේෂ සටහනක් ලෙස වාර්තා කරන බවටත්, එමඟින් මෙරට කිසිදු වෙනත් පාසලකට ඔහුව නැවත ඇතුළත් කර ගැනීමට නොහැකි වන පරිදි ඔහුගේ සමස්ත අධ්‍යාපන අනාගතයම අඳුරට හෙලන බවටත් ඇය විසින් පැමිණිලිකාරිය වෙත තරයේ තර්ජනාත්මකව ප්‍රකාශ කළ බවට පැමිණිලිකාරිය විසින් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකාරිය පවසන පරිදි එම අවස්ථාවේදී, චෝදනා ලත් අංජුල නැමැති සිසුවා පොලිස් ස්ථානය ඉදිරියේ තම වරද පිළිගෙන තිබියදීත් හා මෙම කුමන්ත්‍රණකාරී ක්‍රියාව එස්බොන් සහ අංජුල යන සිසුන් දෙදෙනාගේ ඒකාබද්ධ මෙහෙයවීමෙන් සිදු වූවක් බව සාක්ෂි සහිතව අනාවරණය වී තිබියදීත්, තම නිර්දෝෂී දරුවාට මෙවැනි දරුණු මානසික හා සමාජීය අපරාධයක් සිදු කරන්නේ කුමන පදනමකින්දැයි පැමිණිලිකාරිය විදුහල්පතිනියගෙන් ප්‍රශ්න කර ඇත.අ එහිදී, අතිශය පක්ෂග්‍රාහී ලෙස ක්‍රියා කළ විදුහල්පතිනිය, තමා කිසිදු දිනක උප ප්‍රධාන ශිෂ්‍ය නායක එස්බොන් සිසුවා නීතිය හමුවට පමුණුවන්නේ නැති බවත්, ඔහුට එරෙහිව කිසිදු ආයතනික විනය පරීක්ෂණයක් ක්‍රියාත්මක නොකරන බවටත් ප්‍රකාශ කළ බවට පැමිණිලිකාරිය විසින් කරුණු දක්වා ඇත. තවද, එකී සාක්ෂි සියල්ල ප්‍රතික්ෂේප කරමින්, මෙම විෂමාචාර වරද මුළුමනින්ම සිදු කර ඇත්තේ තම පුතා වන සත්සිදු ඉඳුරංග විසින්ම බවට විදුහල්පතිනිය දැඩි ස්ථාවරයක සිටිමින් අවධාරණය කළ බව පැමිණිලිකාරිය ස්වකීය පැමිණිල්ල මඟින් වැඩිදුරටත් කියා සිටී.

පැමිණිලිකාරිය පවසන පරිදි, ඉන් අනතුරුව ද විදුහල්පතිනිය විසින් පැමිණිලිකාරියට සහ ඇයගේ වින්දිත පුතාට අඛණ්ඩව දෝෂාරෝපණය කර ඇති අතර, "තමුන්ට කැමති ඕනෑම නීතිමය පියවරක් ගන්නා ලෙස "පවසමින් තර්ජනාත්මක ස්වරූපයෙන් අභියෝග කර තිබේ. එම අවස්ථාවේදී අතිශය අසරණභාවයට පත් වූ පැමිණිලිකාරිය, සිය පුතාද ද කැටුව විද්‍යාලයීය පරිශ්‍රයෙන් බැහැරව පැමිණි බව පැමිණිලිකාරිය ස්වකීය ප්‍රකාශය මඟින් කියා සිටී. මෙම ද්වේෂසහගත කුමන්ත්‍රණය හේතුවෙන් තම දරුවාට පාසල් පරිශ්‍රය තුළදී සිදු වූ දැඩි වාචික, මානසික හිංසනය සහ අපහාසය සම්බන්ධයෙන් යුක්තිය පසිඳලීම පිණිස, පැමිණිලිකාරිය විසින් වත්තල පොලිස් ස්ථානය වෙත ගොස් සී.අයි.බී. 105/183 යටතේ පැමිණිල්ලක් ලියාපදිංචි කිරීමට කටයුතු කරන ලද බවට ඇය විසින් කරුණු දක්වා ඇත. එකී පැමිණිල්ල විමර්ශනය කිරීම සඳහා වත්තල පොලිස් ස්ථානය විසින් 2024.09.20, 2024.09.26, 2024.09.30 සහ 2024.10.10 යන දිනයන්හිදී දෙපාර්ශවයම කැඳවීමට පියවර ගෙන තිබුණ ද, පොලිස් ස්ථානය මඟින් නිල වශයෙන් දැනුම් දී තිබියදීත්, අදාළ විමර්ශන කටයුතු සඳහා පාසල් පාලනාධිකාරිය හෝ වගඋත්තරකාර පාර්ශවය නියෝජනය කරමින් කිසිදු නිලධාරියෙකු හෝ පුද්ගලයෙකු සහභාගී වීම සිතාමතාම පැහැර හැර ඇති බව පැමිණිලිකාරිය වැඩිදුරටත් පෙන්වා දී ඇත.

පාසල් බලධාරීන්ගේ මෙම පක්ෂග්‍රාහී සහ වගකීම් විරහිත ක්‍රියාකලාපය හේතුවෙන් තම දරුවාගේ මූලික මානව හිමිකම් මෙන්ම අධ්‍යාපන අයිතිය ද බරපතල ලෙස උල්ලංඝනය වී ඇති බැවින්, පැමිණිලිකාරිය විසින් ස්වකීය අවසන් විකල්පය සහ රැකවරණය පතා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත මෙම පැමිණිල්ල ගොනු කර ඇත. ඒ අනුව, සිය පුතාට සිදු වී ඇති මෙම දැඩි අසාධාරණය, පන්ති තහනම සහ මානසික පීඩනය කෙරෙහි අවධානය යොමු කර, මේ පිළිබඳව අපක්ෂපාතී, විධිමත් සහ විමර්ශනයක් පවත්වා තමන් වෙත සාධාරණත්වය ඉටු කර දෙන ලෙස පැමිණිලි පාර්ශවය මෙම කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.

පැමිණිලිකාරිය පවසන පරිදි සිය පුතාට පාසල තුළදී සිදු වූ අසාධාරණය සම්බන්ධයෙන් පරිපාලනමය පියවරක් ගනු වස්, ඇය විසින් 2024.09.18 වන දින මහර කලාප අධ්‍යාපන කාර්යාලය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. එහෙත්, එකී ආයතනය මඟින් එම පැමිණිල්ල සම්බන්ධයෙන් කිසිදු සාධනීය ප්‍රතිචාරයක් හෝ විමර්ශනයක් සිදු කිරීමට අපොහොසත් වීම හේතුවෙන්, ඇය 2024.11.04 වන දින සෘජුවම අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ගොස් ස්වකීය දුක්ගැනවිල්ල ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. එහිදී, වත්තල ප්‍රදේශය තුළ පිහිටි එකම රජයේ කතෝලික පාසල වත්තල ශාන්ත අන්තෝනි විද්‍යාලය පමණක් වන බැවින් සහ කතෝලික පාලනයට යටත් වෙනත් පාසලක් වෙත සිසුවා මාරු කර යැවීමේ නීතිමය හා පරිපාලනමය බලය පවතින්නේ පළාත් සභාවට බැවින්, ඒ සඳහා බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු වී ඉල්ලීමක් සිදු කරන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශ බලධාරීන් විසින් ඇය වෙත උපදෙස් හා මඟපෙන්වීම් ලබා දී ඇති බවට පැමිණිලිකාරිය විසින් කොමිෂන් සභාව වෙතකරුණු ඉදිරිපත් කර ඇත.

පැන නැගී ඇති තත්ත්වය හමුවේ තම දරුවාගේ මානසික සෞඛ්‍යය සහ අඩාල වූ අධ්‍යාපන කටයුතු යථා තත්ත්වයට පත් කරගැනීමේ අභිලාෂයෙන් ක්‍රියා කළ පැමිණිලිකාරිය, 2025.01.09 වන දින සිය පුතා වත්තල ශාන්ත අන්තෝනි විද්‍යාලයෙන් ඉවත් කර ගැනීමට පියවර ගෙන තිබේ. ඉන් අනතුරුව, උසස් බලධාරීන්ගේ අනුමැතිය පරිදි, 2025.01.16 වන දින ඇය සිය දරුවාව කොටහේන ශාන්ත ලුසියා විද්‍යාලය වෙත ඇතුළත් කරමින් දරුවාගේ අධ්‍යාපන අයිතිය තහවුරු කරගත් බව පැමිණිලිකාරිය විසින් ලේඛන සහිතව කොමිෂන් සභාව වෙත දන්වා ඇත.

<u>වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

<u>1 වන වගඋත්තරකාර වත්තල ශාන්ත අන්තෝනි විද්‍යාලයේ විදුහල්පති එෆ්.එස්. විජේසිංහගේ කරුණු දැක්වීම.</u>

මෙම පැමිණිල්ල විමර්ශනය කිරීමේ පියවරක් වශයෙන්, පැමිණිල්ලේ ප්‍රධාන වගඋත්තරු වන වත්තල ශාන්ත අන්තෝනි විද්‍යාලයේ විදුහල්පතිනිය වෙතින් වාර්තා කැඳවා ඇති අතර ඒ අනුව 2024.10.08 දිනැති නිල වාර්තාව මඟින් උක්ත සිදුවීමට අදාළව විදුහල්පතිනිය විසින් කොමිෂන් සභාව වෙත සිය මූලික කරුණු පැහැදිලි කිරීම් ඉදිරිපත් කර ඇත. තවද, සිද්ධිය පිළිබඳ 2025.01.15, 2025.02.20 හා 2026.05.21 දිනයන්හි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කැඳවා, සිද්ධියට අදාළ ප්‍රකාශ සටහන් කරගෙන ඇත.

වත්තල ශාන්ත අන්තෝනි විද්‍යාලයේ විදුහල්පතිගේ 2024.10.08 දිනැති වාර්තාව මඟින් කරුණු දක්වමින් කියා සිටින්නේ, තමා 2022.10.30 වන දින වත්තල ශාන්ත අන්තෝනි ජාතික පාසලේ විදුහල්පති ධුරයේ රාජකාරි කටයුතු නිල වශයෙන් භාරගෙන සේවයේ නියුක්තව සිටින බවයි. ඇයගේ ප්‍රකාශයට අනුව, ඇය

එම විද්‍යාලයේ වැඩ භාරගන්නා අවස්ථාව වන විට, එකී ශිෂ්‍ය ප්‍රජාව අතර මත්ද්‍රව්‍ය ව්‍යසනය අතිශය බරපතල මෙන්ම උග්‍ර සමාජීය ගැටලුවක් ලෙස මුල් බැසගෙන පැවතී ඇත. මෙම අහිතකර තත්ත්වය පිළිබඳව විද්‍යාලයීය ආචාර්ය මණ්ඩලය, පාසල අවට පදිංචි සිවිල් ප්‍රජාව මෙන්ම වත්තල පොලිස් ස්ථානයේ නිලධාරීන් ද මැනවින් දැනුවත්ව සිටි බව විදුහල්පතිනිය සිය වාර්තාව මඟින් වැඩිදුරටත් අවධාරණය කර සිටී.

මෙම තත්ත්ව පාලනය කිරීම සඳහා තමා විසින් "ජය ටැඹ කරා පුතුන් මෙහෙයවමු" වැඩසටහන වැනි වැඩසටහන් පවත්වන ලද බවත් අවස්ථා ගණනාවක දී කැළණිය විශේෂ කාර්ය බලකායේ පොලිස් නිලධාරීන් හා පොලිස් සුනඛයින් යොදා පාසල් සිසුන් පරීක්ෂා කිරීම සිදු කරන ලද බවටත් කරුණු දක්වා ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පිරිමි දරුවන් තුන්දහසකට ආසන්න ප්‍රමාණයක් සිටින පාසල තුළ උග්‍රව පැවැති මත් උවදුර ඉතාම අවම මට්ටමකට පාලනය කිරීමට හැකියාව ලැබී ඇති බව ද ප්‍රකාශ කොට ඇත. පාසලට මත් ද්‍රව්‍ය රැගෙන ආ සිසුන්ව ඔවුන්ගේ දෙමාපියන් කැඳවා වත්තල පොලිස් ස්ථානය වෙත ද, පාසල තුළ දී මත්ද්‍රව්‍ය භාවිත කළ සිසුන්ව ඔවුන්ගේ දෙමාපියන් කැඳවා ප්‍රතිකාර හා උපදේශනය සඳහා රාගම ශික්ෂණ රෝහල වෙතද, ඇතැම් සිසුන් ඔවුනගේ ගම් ප්‍රදේශවල පන්සල්, පල්ලි හා ආගමික නායකයින් වෙත ද යොමු කරන ලද බවටත් ලේඛන සහිතව කොමිෂන් සභාව වෙත කරුණු ඉදිරිපත් කර ඇත.

එහෙත් ඉතා අල්ප සිසුන් ප්‍රමාණයක් තවමත් පාසල තුලට මත්ද්‍රව්‍ය ගෙන එන බවටත්, භාවිත කරන බවටත් තොරතුරු ලැබී ඇති බැවින් මෙම තත්ත්වය ද පාලනය කිරීම සඳහා ගුරුභවතුන් හා ශිෂ්‍ය නායක පද්ධතිය යොදා ගනිමින් අහඹු ලෙස පාසල් බෑග් පරීක්ෂා කිරීම සිදු කරනු ලබන බවට විදුහල්පතිනිය විසින් වැඩිදුරටත් කරුණු දක්වා ඇත. 2024.09.12 දින එලෙස සිදුකරන ලද සෝදිසියකදී 10 බී ශ්‍රේණියේ ඉගෙනුම ලබන සත්සිඳු ඉදුරංග නමැති සිසුවාගේ පාසල් බෑගය 10 ශ්‍රේණියේ එම්. ඕනාල් භාෂිත නැමැති ශිෂ්‍ය නායකයා විසින් පරීක්ෂා කිරීමේදී මත්ද්‍රව්‍ය බවට හැඟෙන පැකට්ටුවක් හමු වී ඇති බවත් එම ශිෂ්‍ය නායකයා විසින් ඒ බව උප ප්‍රධාන ශිෂ්‍ය නායක එස්බෝන් ට්‍රෙවෝ සිසුවා වෙත දැනුවත් කර පසුව නියෝජ්‍ය විදුහල්පති වලකුඹුර මයා වෙත ඉදිරිපත් කර ඇති බවත්ය. පසුව නියෝජ්‍ය විදුහල්පතිතුමා විසින් සත්සිඳු ඉදුරංග සිසුවා විදුහල්පති වෙත ඉදිරිපත් කරන ලද බවත් තමා විසින් එම සිසුවාගෙන් ප්‍රශ්න කිරීමේදී එම සිසුවා කිසිදු පිළිතුරක් ලබා නොදී නිහඬව සිටින ලද බවටත් කරුණු දක්වා ඇත.

එදින තමා විසින් එම දරුවාගේ දෙමාපියන් කැඳවූ අවස්ථාවේ දී පුංචි අම්මා යැයි කියන අයෙකු පැමිණ සිටි බවත් ඇයට සිද්ධිය දන්වා ලිපියක් සමඟ වත්තල පොලිස් ස්ථානයට යොමු කරන ලද බවත්ය. ඉන් දින කිහිපයකට පසු එනම් 2024.09.19 දින පාසලේ 12 ශ්‍රේණියේ ඉගෙනුම ලබන ආර්.එම්. කවිශ්ක අංජුල නමැති සිසුවා තමා හමුවීමට පැමිණි බවත් 2024.09.12 වන දින මත්ද්‍රව්‍ය පාසල වෙත ගෙන ඒමට සත්සිඳු ඉදුරංග සමඟ ආර්.එම්.කවිශ්ක අංජුල වන තමා සම්බන්ධ වූ බව ඔහු විසින් තමාහට කියා සිටි බවටත් විදුහල්පතිතුමිය විසින් කරුණු දක්වා ඇත. තමා මෙය සිදු කළේ 2023 වර්ෂයේ පාසල හැර ගොස් සිටි ආදි ශිෂ්‍යයෙකු වන සිතුම් අරුෂ නැමැති අයගේ බලපෑම මත බව ද සත්සිඳු ඉදුරංග පාසල තුළ මත්ද්‍රව්‍ය භාවිත කරන බවද ආර්.එම්.කවිශ්ක අංජුල සිසුවා තමාහට ප්‍රකාශ කරන ලද බවටද විදුහල්පතිතුමිය විසින් කරුණු දක්වා ඇත. එහිදී ආර්.එම්. කවිශ්ක අංජුල සිසුවා විසින් විදුහල්පති වෙත ලබා දුන් ලිඛිත ප්‍රකාශයේ පිටපතක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

ඉහත සිද්ධිය සම්බන්ධයෙන් තමා විසින් 2024.09.19 වන දින පාසල් විනය කමිටුව රැස් කර සිද්ධියට සම්බන්ධ ශිෂ්‍ය නායකයින් වන එම්.ඕනාල් භාෂිත, එස්බෝන් ට්‍රෙවෝ යන සිසුන් ද ගෙන්වා විධිමත් විමර්ශනයක් සිදු කරන ලද බවත් සත්සිඳු ඉදුරංග සිසුවා ද ගෙන්වා ගැනීමට පන්ති භාර ගුරුභවතා මඟින්

එම සිසුවාගේ මවට දුරකථන ඇමතුමක් ලබා දුන්නද ඇය පැමිණීම ප්‍රතික්ෂේප කරන ලද බවටද විදුහල්පතිනිය විසින් කරුණු දක්වා ඇත. මෙම සිසුන්ගෙන් ලබා ගත් තොරතුරු පදනම් කරගෙන විනය කමිටුව විසින් සත්සිඳු ඉදුරංග ශිෂ්‍යයා සති 2ක උපදේශනයක් සඳහා යොමු කිරීමටත්, ආර්.එම්.කවිශ්ක අංජුල සිසුවා වෙනත් පාසලකට මාරු කිරීමට දෙමාපියන් වෙත යෝජනා කිරීමටත්, මෙම සිදුවීම පසුපස සිටින ජේ.ඒ. සිතුම් අරුෂ යන ආදි ශිෂ්‍යයාට පාසල් පරිශ්‍රයට නිකරුණේ ඇතුලු වීම තහනම් කිරීමටත් එහිදී තීරණය කරන ලද බවට කරුණු දක්වා ඇත. තවද ආර්.එම්.කවිශ්ක අංජුල සහ සත්සිඳු ඉදුරංග යන සිසුන් දෙදෙනා ඒ වන විට පාසලෙන් අස් කිරීමක් කිසිදු ලෙසකින් සිදු කර නොමැති බව ද කොමිෂන් සභාව වෙත කරුණු දක්වා ඇත.

පාසල් දරුවන්ව මත්ද්‍රව්‍ය භාවිතය සඳහා පෙළඹවීමට ඉතා අල්ප සිසුන් පිරිසක් බාහිර බලවේගයන්ගේ ද සහාය ඇතිව කටයුතු සිදු කරමින් පවතින බවට කරුණු අනාවරණය වී ඇති බවත් එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම සිද්ධිය ද පාදක කරගෙන තමා හා ශිෂ්‍ය නායක පද්ධතිය අපහසුතාවයට පත් කිරීමේ අරමුණ පෙරදැරි කරගෙන පොලිස් ස්ථානයට, කලාප අධ්‍යාපන කාර්යාලයට හා මානව හිමිකම් කොමිෂන් සභාව වැනි ආයතනවලට පැමිණිලි කර ඔවුන්ගේ අභිමතාර්ථයන් ඉටු කර ගැනීමට එම පිරිස කටයුතු කරන බවටද විදුහල්පතිතුමිය විසින් කරුණු දක්වා ඇත.

තමා විසින් ගුරු මණ්ඩලය හා ශිෂ්‍ය නායක පද්ධතිය මෙහෙයවමින් දැඩි උත්සාහයක යෙදෙන්නේ දැයේ ජීවනාලිය බඳු පිරිමි දරුවන් මත් උවදුරෙන් වලක්වා ගෙන යහමඟට ගැනීම උදෙසා පමණක්ම බවත් මෙම සිද්ධිය සම්බන්ධයෙන් තමා ගත් සෑම පියවරක්ම ඒ සඳහා බවටත් විදුහල්පතිනිය විසින් කොමිෂන් සභාව වෙත වැඩිදුරටත් ප්‍රකාශ කොට ඇත.

**<u>2 වන වගඋත්තරකරු වන කැලණිය කලාප අධ්‍යාපන කාර්යාලයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ කරුණු දැක්වීම.</u>**

මෙම පැමිණිල්ලේ වින්දිත දරුවාගේ මව විසින් කැලණිය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කරන ලද දින රහිත ලිපිය අනුව කැලණිය කලාප අධ්‍යාපන කාර්යාලය වෙත මෙම පැමිණිල්ල වාර්තා වී ඇත. ඒ අනුව ඒ සම්බන්ධව කැලණිය කලාප අධ්‍යාපන කාර්යාලය විසින් සිදු කරන ලද පරීක්ෂණයේ වාර්තාව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ 2025.05.26 දිනැති ලිපිය සමග කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.

එම පරීක්ෂණ වාර්තාව අනුව බප/කැල/ශාන්ත අන්තෝනි විද්‍යාලය මඟින් මෙම සිදුවීම සම්බන්ධයෙන් අභ්‍යන්තර පරීක්ෂණයක් පවත්වා විධිමත් ලෙස වාර්තා තබා නොමැති බවත් ආර්.එම්.කවිෂ්ක අංජුල සිසුවා විසින් වී.පී.සත්සිඳු ඉදුරංග සිසුවාගේ බෑගයට මත්ද්‍රව්‍ය දැමීමේ වරද පිළිගෙන ඇති බව පරීක්ෂණයේදී අනාවරණ වී ඇති බවටත් සඳහන් කරමින් දරුවන් සම්බන්ධ මෙවැනි ගැටලු වලදී නිවැරදිව සොයා බලා තීරණ ගන්නා ලෙසට අවධාරණය කරමින් විදුහල්පතිනිය සම්බන්ධයෙන් අවවාද ලිපියක් ලබා දීමට නිර්දේශ කර ඇත.

**<u>3 වන වගඋත්තරකාර වත්තල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිගේ කරුණු දැක්වීම.</u>**

වත්තල පොලිස් ස්ථානාධිපතිවරයා විසින් 2025.01.09 දිනැතිව වාර්තාව මඟින් පැමිණිල්ලට අදාළව මෙම කොමිෂන් සභාව වෙත කරුණු වාර්තා කර ඇත.

එම වාර්තාවට අනුව, පැමිණිලිකාරිය වන දිනූෂා හර්ෂණි ලෝගුස් නැමැත්තිය විසින් තම දරුවාට පාසල තුළදී සිදු වූයේ යැයි කියනු ලබන අපහාසයක් සම්බන්ධයෙන්, 2024.09.18 වන දින CIB. (1) 05/183 යටතේ වත්තල පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් යොමු කර ඇත.

එකී පැමිණිල්ල අදාළ විද්‍යාලයේ විදුහල්පතිට එරෙහිව ගොනු කර ඇති බැවින් සහ ඒ පිළිබඳ විමර්ශන කටයුතු මෙහෙයවීමේ නීත්‍යානුකූල බලය කලාප අධ්‍යාපන කාර්යාලය සතු වන බැවින්, ඒ සම්බන්ධයෙන් විධිමත් විමර්ශනයක් පවත්වන ලෙස මහර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත 2024.10.16 දිනැති නිල ලිපිය මගින් දැනුම් දෙන ලද බවට ස්ථානාධිපති විසින් කරුණු දක්වා ඇත. ඒ බව සනාථ කරමින්, අදාළ ලිපියේ පිටපතක් මෙන්ම පැමිණිලිකාරිය විසින් පොලිස් ස්ථානයට සිදු කළ පැමිණිල්ලේ මුල් පැමිණිලි ප්‍රකාශයේ පිටපතක්ද සහිතව මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

එමෙන්ම, වත්තල ශාන්ත අන්තෝනි විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින්, සත්සිදු ඉදුරංග නැමැති ශිෂ්‍යයා පාසල් පරිශ්‍රය තුළට මත්ද්‍රව්‍ය රැගෙන එන බවට සහ ඒවා භාවිත කරන බවට සඳහන් කරමින් පොලිස් ස්ථානාධිපතිවරයා වෙත යොමු කරන ලදැයි කියනු ලබන කිසිදු ලිපියක් තමා වෙත ලැබී නොමැති බව ස්ථානාධිපතිවරයා සිය වාර්තාව මගින් වැඩිදුරටත් අවධාරණය කර ඇත.

පැමිණිල්ලට අදළව 2026.01.26 දිනැතිව මෙම කොමිෂන් සභාව හමුවේ පවත්වන ලද පරීක්ෂණ අවස්ථාවේ දී, වත්තල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි පො.සැ. ඩබ්.එම්.ඩී.එල්.ජයසිංහ නිලධාරියා විසින් ප්‍රකාශ කොට ඇත්තේ, මෙම පැමිණිල්ලට පාදක වූ කරුණු සම්බන්ධයෙන් අදාළ සියලු පාර්ශවකරුවන් කැඳවා එවකට ස්ථානාධිපතිවරයා විසින් පූර්ව විමර්ශන කටයුතු මෙහෙයවා ඇති බවයි.

තවද, එම සිදුවීමට අදාළව එවකට වත්තල පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන ඒකකයේ රාජකාරී නියුක්තව සිටි පොලිස් පරීක්ෂක හේරත් නිලධාරියා විසින් විමර්ශන සිදු කර ඇති බවත්, එහිදී ප්‍රශ්නගත පාර්සලය මත්ද්‍රව්‍ය නොවන බවට තහවුරු කරගෙන ඇති බවත්, එම පාර්සලය පාසල තුළට රැගෙනවිත් ඇත්තේ වෙනත් ශිෂ්‍යයකු විසින් බවට අනාවරණය කරගෙන ඇති බවත් උක්ත නිලධාරියා විසින් වැඩිදුරටත් සාක්ෂි දරමින් ප්‍රකාශ කර ඇත.

එම විමර්ශනයේදී අනාවරණය වූ කරුණු අනුව, මෙම පැමිණිල්ලට අදාළ සිදුවීම සම්බන්ධයෙන් විමර්ශන කටයුතු මෙහෙයවා ඇති, එවකට වත්තල පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන ඒකකයට අනුයුක්තව සේවය කළ පොලිස් පරීක්ෂක හේරත් යන නිලධාරියා කොමිෂන් සභාව හමුවට කැඳවා 2026.06.18 දින පරීක්ෂණයක් පවත්වා ඇත. එහිදී අදාළ නිලධාරියා ප්‍රකාශ කර ඇත්තේ, 2024.09.13 වන දින පැමිණිලි පාර්ශවය පොලිස් ස්ථානය වෙත පැමිණි බවට තමාට පූර්ව දැනුවත්භාවයක් හෝ නිල තොරතුරක් නොතිබූ බවයි. කෙසේ වුවද, පසු දිනක රාත්‍රී 10:00 ට පමණ පැමිණිලිකාර පාර්ශවය පොලිස් ස්ථාන පරිශ්‍රයේ රැඳී සිටි අවස්ථාවක, ඔවුන් එහි රැඳී සිටීමට හේතුව පිළිබඳව තමා ප්‍රශ්න කළ බවත්; එහිදී තමන් මීට පෙරද පොලිස් ස්ථානය වෙත පැමිණ ස්ථානාධිපතිවරයා හමුවී ඇති බවත්, එම අවස්ථාවේදී තමන් සතු සාක්ෂියක් සම්බන්ධයෙන් ස්ථානාධිපතිවරයා දැනුවත් කිරීමේ අරමුණින් එදින පැමිණි බවත් ඔවුන් තමාට ප්‍රකාශ කළ බවයි. ඉන්පසු තමා විසින් ඔවුන්ව අපරාධ විමර්ශන අංශය වෙත කැඳවා, ඔවුන් සතු ජංගම දූරකථනයක පටිගත කර තිබූ හඬපටයකට සවන් දීමෙන් අනතුරුව, එමගින් අනාවරණය වූ තොරතුරුවලට අනුව පැමිණිලිකරුවන් විසින් ලබාදෙන ලද දූරකථන අංක ඔස්සේ පාසල් සිසුන් කිහිපදෙනෙකු සම්බන්ධ කර ගනිමින්, අදාළ විමර්ශන කටයුතු සඳහා 2024.09.16 වන දින පොලිස්

ස්ථානය වෙත වාර්තා කරන ලෙස ඔවුන්ට දන්වා ඇත. 2024.09.16 වන දින, අදාළ පාසලේ විදුහල්පතිනිය සහ උප ප්‍රධාන ශිෂ්‍ය නායකයා හැර සෙසු පාර්ශවයන් පොලිස් ස්ථානය වෙත පැමිණ සිටි බවත්, පැමිණ සිටි පාර්ශවයන්ගෙන් සිද්ධියට අදාළ ප්‍රකාශ සටහන් කර ගැනීමෙන් අනතුරුව, නැවත දැනුම් දීමකින් පසු පොලිස් ස්ථානය වෙත පැමිණෙන ලෙස තමා පැමිණිලිකාර පාර්ශවයට උපදෙස් දුන් බවත් ඔහු ප්‍රකාශ කළේය.

තම මතකය පරිදි, මෙම සිදුවීමට අදාළව සෙසු පාර්ශවයන්ගේ ප්‍රකාශ සටහන් කර ගැනීම සඳහා, එවකට විවිධ පැමිණිලි අංශයේ ස්ථානාධිපති ලෙස කටයුතු කළ උප පොලිස් පරීක්ෂක මදී අලගන් නිලධාරියා වෙත හෝ ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපති ලෙස කටයුතු කළ කාන්තා උප පොලිස් පරීක්ෂක කුමාරිහාමි නිලධාරිනිය වෙත තමා විසින් උපදෙස් ලබා දුන් බව හෙතෙම සඳහන් කළේය. තවද, මෙම සිද්ධිය සම්බන්ධයෙන් වන විමර්ශන කාර්යය පොලිස් ස්ථානයේ විවිධ පැමිණිලි අංශය සහ ළමා හා කාන්තා කාර්යාංශය මඟින් ක්‍රියාත්මක වූ බවත්, ස්ථානාධිපතිවරයා පොලිස් ස්ථානයේ නොසිටි අවස්ථාවක පැමිණිලි පාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරුවල සත්‍ය අසත්‍යතාව පරීක්ෂා කර, වැඩිදුර විමර්ශන කටයුතු සඳහා අදාළ විෂයභාර අංශ වෙත යොමු කිරීම පමණක් තමා විසින් සිදු කරන ලද බවත් එම නිලධාරියා කොමිෂන් සභාව හමුවේ අවධාරණය කර සිටියේය.

එම නිලධාරියාගේ ප්‍රකාශයෙන් අනාවරණය වූ කරුණු අනුව සිද්ධිය සිදු වන අවස්ථාවේ වත්තල පොලිස් ස්ථානයේ උප පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස රාජකාරී සිදු කළ මදී අලගන් නිලධාරියා හා එවකට වත්තල පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපති ලෙස රාජකාරී කළ කාන්තා උප පොලිස් පරීක්ෂක ආර්.එම්.චන්ද්‍රා කුමාරිහාමි නිලධාරිනිය කැඳවා 2026.06.25 දින මෙම කොමිෂන් සභාව හමුවේදී පරීක්ෂණයක් සිදු කර ඇත. ආර්.එම්.චන්ද්‍රා කුමාරිහාමි නිලධාරිනිය හා මදී අලගන් නිලධාරියා විසින් ප්‍රකාශ කර ඇත්තේ පැමිණිලිකාරිය විසින් 2024.09.18 වන දින CIB (1) 05/183 යටතේ ඇයගේ දරුවාට පාසලෙන් සිදු වූවා යැයි කියන අසාධාරණයක් සම්බන්ධව කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් පමණක් ස්ථානාධිපතිගේ නියෝග අනුව කටයුතු කර කලාප අධ්‍යාපන කාර්යාලය වෙත ලිපියක් මඟින් යොමු කිරීමට කටයුතු කිරීම පමණක් ඔවුන් විසින් සිදු කළ බවයි. ඊට පෙර එම පැමිණිල්ලට අදාළව ස්ථානය තුළ සිදු වූවායැයි කියන කිසිදුර විමර්ශනයක් සම්බන්ධයෙන් ඔවුන් නොදන්නා බවත් කිසිදු පාර්ශවයකගෙන් ඔවුන් ප්‍රකාශ සටහන් කර නොගන්නා ලද බවත් ප්‍රකාශ කර ඇත.

<u>නිරීක්ෂණ</u>

වත්තල ශාන්ත අන්තෝනි විද්‍යාලයේ 10 ශ්‍රේණියේ ඉගෙනුම ලැබූ සිය දරුවාට පාසල තුළදී සිදුවූවා යැයි කියනු ලබන සිද්ධිය සම්බන්ධව දරුවාගේ මව විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර තිබූ පැමිණිල්ල අනුව එහි පැමිණිලි පාර්ශවය, වගඋත්තර පාර්ශවයන් මෙන්ම අගතියටය පත් පාර්ශවය කොමිෂන් සභාව හමුවට කැඳවා සාක්ෂි හා ප්‍රකාශ සටහන් කරගෙන ඇත. පැමිණිලිකරුගේ පැමිණිල්ලට අදාළ කරුණු ද, විමර්ශන අවස්ථාවේදී පැමිණිලිකරු සහ වගඋත්තරකරුවන් විසින් සිදු කරන ලද කරුණු දැක්වීම් ද, ද්විපාර්ශවීය වාර්තා හා ලිඛිත දේශන ද, කොමිෂන් සභාව විසින් ස්වාධීනව කැඳවන ලද අනෙකුත් ආයතනික හා නිල වාර්තා ද ඇතුළුව, මේ දක්වා මෙම සිදුවීමට අදාළව පරිශීලනයට ලක්වූ සමස්ත සාක්ෂි සහ කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය වේ.

- 2024.09.12 වන දින උදෑසන වත්තල ශාන්ත අන්තෝනි ජාතික පාසලේ පාසල් දොරටුව අසළ බෑග් පරීක්ෂාවේදී 10-B ශ්‍රේණියේ ඉගෙනුම ලබන වී.පී. සත්සිඳු ඉදුරංග (වින්දිත සිසුවා) සිසුවාගේ බෑගය තුළ තිබී දුම්කුඩු නමැති පැකට්ටුවක් ශිෂ්‍ය නායකයන් වෙත හමු වී එය පාසල් පාලනාධිකාරිය වෙත ඉදිරිපත් කර තිබේ. එම සිදුවීම මත පදනම්ව සත්සිඳු ඉදුරංග නැමැති සිසුවා විසින් පාසල තුළට මත්ද්‍රව්‍ය ගෙන එන බවට හා පාසල තුළ මත්ද්‍රව්‍ය භාවිත කරන බවට සාක්ෂි අනාවරණය වී ඇති බව සඳහන් කරමින් ඒ පිළිබඳ පොලිසියේ අවධානය යොමු කරන ලෙසට දන්වමින් වත්තල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති අමතන ලද 2024.09.12 දිනැති ලිපියක් ද සමගින් වින්දිත සිසුවා පොලිස් ස්ථානය වෙත යොමු කිරීමට විදුහල්පතිනිය විසින් කටයුතු කර ඇත. සිද්ධිය සබැඳිව වත්තල ශාන්ත අන්තෝනි විද්‍යාලයේ විදුහල්පතිනිය විසින් වත්තල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති අමතන ලද 2024.09.12 දිනැති ලිපියේ පිටපතක් පැමිණිලි පාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අතර එවැනි අන්තර්ගතයකින් යුතු ලිපියක් ද සමගින් අගතියට පත් ශිෂ්‍යයා සහ ඔහුගේ භාරකරු වත්තල පොලිස් ස්ථානය වෙත යොමු කළ බව වගඋත්තරකාර විදුහල්පතිනිය විසින් ද අවිවාදිතව පිළිගෙන තිබේ. එම ලිපියෙහි විදුහල්පතිනිය විසින් සඳහන් කර ඇත්තේ, සත්සිඳු ඉදුරංග නැමැති සිසුවා විසින් පාසල තුළට මත්ද්‍රව්‍ය ගෙන එන බවට හා පාසල තුළ මත්ද්‍රව්‍ය භාවිත කරන බවට සාක්ෂි අනාවරණය වී ඇති බැවින් ඒ පිළිබඳ පොලිසියේ අවධානය යොමු කරන ලෙසටය.

එසේ වුවද, සත්සිඳු ඉදුරංග ශිෂ්‍යයා විසින් මත්ද්‍රව්‍ය පාසල තුළට රැගෙන එන බවට හා පාසල තුළ භාවිත කර ඇති බව සනාථ කෙරෙන කිසිදු සාක්ෂියක් හෝ තොරතුරක් මෙම කොමිෂන් සභාව හමුවේ සිදු කරන ලද පරීක්ෂණ අනුව අනාවරණය වී නොමැත. මෙම පැමිණිල්ල විභාග කිරීම සඳහා වත්තල ශාන්ත අන්තෝනි විද්‍යාලයීය විදුහල්පතිනිය කොමිෂන් සභාව හමුවට කැඳවා 2025.02.20 දින ප්‍රකාශ සටහන් කරගෙන ඇති අතර, එහිදී සත්සිඳු ඉදුරංග ශිෂ්‍යයා මත්ද්‍රව්‍ය පාසල් පරිශ්‍රයට රැගෙන එන බවට හා පාසල තුළ ඒවා භාවිත කරන බවට ස්ථිර නිගමනයකට එළඹ, ඔහු පොලිස් ස්ථානය වෙත යොමු කිරීමට තරම් පාසල් බලධාරීන් සන්තකයේ පැවති ප්‍රත්‍යක්ෂ සාක්ෂි කවරේ දැයි විමසීමට ලක් කරන ලදී. එහිදී විදුහල්පතිනිය ප්‍රකාශ කර ඇත්තේ, අදාළ සිදුවීම සිදු වූ අවස්ථාවේදී සත්සිඳු ඉදුරංග සිසුවා සම්බන්ධයෙන් ශිෂ්‍ය නායකයන් විසින් වාචිකව සිදු කරන ලද කරුණු දැක්වීම් සහ චෝදනා ප්‍රමාණවත් සාක්ෂි ලෙස සලකා, තමා එම තීරණයට එළඹි බවයි. තවද සිද්ධිය සම්බන්ධයෙන් එය සිදු වූ අවස්ථාවේදී සත්සිඳු ඉදුරංග සිසුවාගෙන් විමසීමේදී ඔහු කිසිවක් ප්‍රකාශ නොකර නිහඬව සිටීම නිසාවෙන් සිද්ධියට සම්බන්ධ පාසලෙන් පිටත පුද්ගලයන් හඳුනා ගැනීමේ අරමුණින් ඔහුව පොලිස් ස්ථානය වෙත යොමු කිරීමට කටයුතු කළ බවට විදුහල්පතිනිය විසින් කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කොට ඇත.

මේ අනුව එකී සිදුවීම සිදු වූ දිනයේදීම, සිසුවා වින්දිත සිසුවා කිසිවක් ප්‍රකාශ නොකොට නිහඬව සිටීම යන කරුණ හා මත්ද්‍රව්‍ය බවට සැක කෙරෙන පාර්සලයක් එම (අගතියට පත්) ශිෂ්‍යයාගේ පාසල් බෑගය තුළ තිබී හමුවීම යන ඒකපාර්ශවීය කරුණ පමණක් පදනම් කරගනිමින්, අදාළ ශිෂ්‍යයා මත්ද්‍රව්‍ය පාසල තුළට රැගෙන එන බවට හා පාසල තුළ මත් ද්‍රව්‍ය භාවිත කරන බවට විදුහල්පතිනිය විසින් නිගමනයකට එළඹ ඇති බව නිරීක්ෂණය වේ. එමෙන්ම, ඒ සඳහා වෙනත් කිසිදු පරිවේෂණීය හෝ ප්‍රත්‍යක්ෂ සාක්ෂියක් නොමැති පසුබිමක, පාසල සන්තකයේ සාක්ෂි පවතින බවට නිගමනයන්ට එළඹෙමින්, එවැනි සාවද්‍ය සඳහනක් සහිත ලිපියක් ද සමගින් වින්දිත සිසුවා පොලිස් ස්ථානය වෙත යොමු කිරීමට කටයුතු කර ඇති ආකාරයක් නිරීක්ෂණය වේ.

- තවදුරටත්, විදුහල්පතිනිය විසින් 2022 සහ 2023 යන වර්ෂයන්හිදී, මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සම්බන්ධයෙන් විද්‍යාලය තුළ චෝදනාවට ලක් වූ ශිෂ්‍යයන් කිහිප දෙනෙකු, ඔවුන්ගේ අනන්‍යතාවයන්/නාමලේඛන ද සහිතව, මත්ද්‍රව්‍ය නිවාරණ උපදේශනය සහ වෛද්‍ය ප්‍රතිකාර සඳහා රාගම ශික්ෂණ රෝහල, වත්තල පොලිස් ස්ථානය සහ අදාළ ආගමික ස්ථාන වෙත මෙම සිදුවීමට පූර්වයෙන් යොමු කර ඇති බවට කරුණු නිරීක්ෂණය වේ. කෙසේ වෙතත්, එලෙස උපදේශන හෝ වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කරන ලද ශිෂ්‍යයන් අතර වී. පී. සත්සිඳු ඉඳුරංග නැමැති ශිෂ්‍යයාගේ නම ඇතුළත් වී නොමැති බව ඉදිරිපත්ව ඇති ලේඛන ප්‍රකාරව පැහැදිලි වේ.

  එසේම, පාසල තුළට මත්ද්‍රව්‍ය රැගෙන එන සහ භාවිත කරන බවට හඳුනාගත් ශිෂ්‍යයන් විසින් ලබා දී ඇති සහ විදුහල්පතිනිය විසින් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇති කටඋත්තර/ප්‍රකාශයන්හි කිසිදු ස්ථානයක, සත්සිඳු ඉඳුරංග නැමැති ශිෂ්‍යයා පාසල් පරිශ්‍රය තුළ මත්ද්‍රව්‍ය භාවිත කරන බවට හෝ විද්‍යාලය තුළට මත්ද්‍රව්‍ය රැගෙන එන බවට කිසිදු සාක්ෂිමය කරුණක් හෝ පාපොච්චාරණයක් අනාවරණය වී නොමැති බව නිරීක්ෂණය වේ. ඒ අනුව, මෙම ප්‍රශ්නගත සිදුවීමට පූර්වයෙන්, වින්දිත ශිෂ්‍යයා පාසල තුළ මත්ද්‍රව්‍ය භාවිත කළ බවට හෝ පාසල් පරිශ්‍රය තුළට මත්ද්‍රව්‍ය රැගෙන ආ බවට පූර්ව චෝදනා ලැබූ හෝ පූර්ව වාර්තා පවතින ශිෂ්‍යයෙකු නොවන බව නිරීක්ෂණය වේ.

  පාසලක සමස්ත පරිපාලන ක්‍රියාවලිය, ශිෂ්‍ය විනය මෙන්ම ශිෂ්‍ය ප්‍රජාවගේ පරම සුභසාධනය උදෙසා ප්‍රමුඛතම වගකීම දැරීමට බැඳී සිටින ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන්, මෙම සිදුවීමේදී අදාළ විදුහල්පතිනිය ක්‍රියා කර ඇති ආකාරය ගැටලුසහගත වන අතර විදුහල්පතිනිය විසින් මෙම සංවේදී සිදුවීමට අදාළව සාක්ෂි විමසා බලා විධිමත් මෙන්ම අපක්ෂපාතී අභ්‍යන්තර විමර්ශනයක් මෙහෙයවීමකින් තොරව, ශිෂ්‍ය නායකයින් විසින් ඉදිරිපත් කරන ලද වාචික ප්‍රකාශ මත පමණක් ඒකපාර්ශවීයව පදනම් වෙමින්, වින්දිත ශිෂ්‍යයා වත්තල පොලිස් ස්ථානය වෙත යොමු කිරීමට පියවර ගැනීම මඟින් අදාළ ශිෂ්‍යයාගේ මානසික වර්ධනයට, සමාජයීය ප්‍රතිරූපයට සහ පෞරුෂත්ව සංවර්ධනය කෙරෙහි අහිතකර බලපෑමක් එමගින් එල්ල වියහැකි බව මෙම කොමිෂන් සභාව නිරීක්ෂණය කරනු ලබයි.

- විද්‍යාලය වෙත මත්ද්‍රව්‍ය රැගෙන ආ ශිෂ්‍යයන්, ඔවුන්ගේ භාරකරුවන්/දෙමව්පියන් ද කැඳවා වත්තල පොලිස් ස්ථානය වෙත ද, පාසල් පරිශ්‍රය තුළ මත්ද්‍රව්‍ය භාවිත කළ ශිෂ්‍යයන්, ඔවුන්ගේ භාරකරුවන්/දෙමව්පියන් ද කැඳවා වෛද්‍ය ප්‍රතිකාර මෙන්ම උපදේශන සේවා සඳහා රාගම ශික්ෂණ රෝහල වෙත ද යොමු කිරීමට පියවර ගත් බව විදුහල්පතිනිය විසින් ඉදිරිපත් කරන ලද 2024.10.08 දිනැති වාර්තාව මඟින් කොමිෂන් සභාව වෙත තහවුරු කර ඇත. තවදුරටත්, මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් එලෙස චෝදනා ලැබූ වෙනත් ශිෂ්‍යයන් ද විදුහල්පතිනිය විසින් නිල ලිපි මඟින් වත්තල පොලිස් ස්ථානය වෙත යොමු කර ඇති බව ඉදිරිපත් කර ඇති ලේඛනගත සාක්ෂි ප්‍රකාරව සනාථ වේ. කෙසේ වෙතත්, ඉහත කී ශිෂ්‍යයන් සම්බන්ධයෙන් විදුහල්පතිනිය විසින් වත්තල පොලිස් ස්ථානාධිපතිවරයා වෙත යොමු කරන ලද ලිපිවල අන්තර්ගතය සහ වින්දිත ශිෂ්‍යයා සම්බන්ධයෙන් යොමු කරන ලද ලිපියේ අන්තර්ගතය අතර පැහැදිලි වෙනසක් පවතින බව නිරීක්ෂණය වේ.

  සෙසු ශිෂ්‍යයන් පොලිස් ස්ථානය වෙත යොමු කර ඇත්තේ, එම ශිෂ්‍යයන් මත්ද්‍රව්‍ය නිවාරණ උපදේශනය හා වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කරන ලෙස ඉල්ලා සිටිමිනි. නමුත්, සත්සිඳු ඉඳුරංග නැමැති ශිෂ්‍යයා සම්බන්ධයෙන් වත්තල පොලිස් ස්ථානාධිපතිවරයා වෙත විදුහල්පතිනිය විසින් යොමු කරන ලද 2024.09.12 දිනැති ලිපියෙහි, ඉහත සඳහන් කරන ලද සෙසු ලිපිවල අන්තර්ගතයට හාත්පසින්ම වෙනස්ව යමින්, සත්සිඳු ඉඳුරංග නැමැති ශිෂ්‍යයා විසින් පාසල් පරිශ්‍රය තුළට මත්ද්‍රව්‍ය

රැගෙන එන බවට සහ පාසල තුළ මත්ද්‍රව්‍ය භාවිත කරන බවට සාක්ෂි අනාවරණය වී ඇති බැවින්, ඒ පිළිබඳව පොලිස් අවධානය යොමු කරන ලෙස සඳහන් කර ඇත. ඒ අනුව, විද්‍යාලයීය පාලනාධිකාරිය විසින් පවත්නා සාමාන්‍ය ක්‍රමවේදයෙන් පරිබාහිරව යමින් වින්දිත ශිෂ්‍යයා සම්බන්ධයෙන් පමණක් පූර්ව නිගමනයකට එළඹ, අසමාන ආකාරයකින් ක්‍රියා කර ඇති බවක් නිරීක්ෂණය වේ.

- සිද්ධිය සිදු වී දින 7කට පසු එනම් 2024.09.19 දින එම සිදුවීම පාදක කරගනිමින් පාසල් විනය කමිටු රැස්වීමක් පවත්වා එහිදී 12 ශ්‍රේණියේ කවිශ්ක අංජුල යන සිසුවා විසින් මත්ද්‍රව්‍ය පාසලට ගෙන ඒමට 10 බී පන්තියේ සත්සිඳු ඉඳුරංග ද සම්බන්ධ කර ගත් බවට පිළිගත් නිසා ද ඔහු පාසල තුල මත්ද්‍රව්‍ය භාවිත කළ බව ප්‍රකාශ කළ නිසා ද ඔවුන් සම්බන්ධව විනය ක්‍රියාමාර්ග ගැනීමට විනය කමිටුව තීරණය කරන ලද බවට වගඋත්තරකාර විදුහල්පතිනියගේ කරුණු දැක්වීම් අනුව පෙනී යයි. ඒ අනුව මෙම සිදුවීමට සම්බන්ධ වූ 10 බී පන්තියේ සත්සිඳු ඉඳුරංග සිසුවාට සති දෙකක පන්ති උපදේශනයක් පැනවීමට පන්ති භාර ගුරුවරයාට යොමු කරන ලද බවටද වගඋත්තරකාර විදුහල්පතිනිය කරුණු දක්වා ඇත. එහෙත් කවිශ්ක අංජුල සිසුවා විසින් විදුහල්පති අමතන ලද 2024.09.19 දිනැති ලිපියේ පිටපතක් විදුහල්පතිනිය විසින් මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අතර එම ලිපියේ මෙම සිද්ධියට අදාළව ඉතා පැහැදිලිව කරුණු දක්වා ඇත්තේ,

***"මම බදාදා උදෑසන පාසල් පැමිණ වැසිකිලිය දෙසට ගියා. වැසිකිලිය ඇතුලේ තිබී දුම්කුඩු පැකට් 2ක් හමුවුණා. එයින් එකක් මා ගෙන ගොස් පාසලේ සිටින 10 ශ්‍රේණියේ සත්සිඳු ඉඳුරංග මල්ලිගේ බෑගයට ඔහු පාසලට එන විට දැමුවා. ශිෂ්‍ය නායකයින් මෙයට සම්බන්ධ නැත. මම සත්සිඳුගේ බෑගයට දුම් කුඩු දැමුවේ ඒ මල්ලි මගේම නංගීත් එක්ක යාලු වෙන්න අහලා වද දුන්න නිසා ඒ මල්ලී අපේ අම්මාගේ දුරකථනයට ඒ මල්ලී බොන පින්තූරයක් එවලා තිබුණා. ඒකේ තරහටයි මම ඒ මල්ලී ගේ බෑග් එකට දුම් කුඩු දැම්මේ.."* යනුවෙනි.**

ආර්.එම්. කවිෂ්ක අජුල නමැති සිසුවා විසින් වී.පී. සත්සිඳු ඉඳුරංග සිසුවාගේ බෑගයට දුම්කුඩු දැමීමේ වරද පිළිගෙන ඇති බවත්, එයට හේතුව පල්ලියේ දහම් පාසලේ ඉගෙනුම ලබන සත්සිඳු ඉඳුරංග සිසුවා සහ කවිෂ්ක අංජුල සිසුවාගේ සහෝදරිය අතර සම්බන්ධයක් ඇති නිසා බවත් සහ සත්සිඳු සිසුවා තම සොයුරියගේ ඡායාරූප ගෙන්වා ගත් බවට යහළුවන්ට පැවසීම නිසා බවත් අංජුල සිසුවාගේ උක්ත ප්‍රකාශය අනුව පැහැදිලිව නිරීක්ෂණය වේ. තවද 2024.09.19 දිනැති පාසල් විනය කමිටු සටහන් පොතෙහි මෙම සිදු වීම සටහන් කර ඇත්තේ 2024.09.19 දින පාසල් විනය කමිටුව රැස්වීමක් පැවැත්වූ බවත් එහිදී ගත් තීරණවලට අනුව 12 ශ්‍රේණියේ ඉගෙනුම ලබන අංජුල යන සිසුවා මත්ද්‍රව්‍ය පාසලට ගෙන ඒමට 10 බී පන්තියේ සත්සිඳු ඉඳුරංග සිසුවා ද සම්බන්ධ කර ගත් බවට පිළිගත් නිසා ඔහු සම්බන්ධව විනය ක්‍රියාමාර්ග ගැනීමට කමිටුව තීරණය කරන ලද බවටය. නමුත් කවිෂ්ක අංජුල සිසුවා විසින් එදින විදුහල්පති වෙත ඉදිරිපත් කරන ලද පෙර සඳහන් ලිපියෙහි කවිෂ්ක අංජුල යන සිසුවා මත්ද්‍රව්‍ය පාසලට ගෙන ඒමට 10 බී පන්තියේ සත්සිඳු ඉඳුරංග සිසුවා සම්බන්ධ කර ගත් බවට කිසිදු කරුණක් අන්තර්ගත නොවන බව නිරීක්ෂණය වේ.

අංජුල සිසුවාගේ මෙම ලිඛිත ප්‍රකාශය අනුව වින්දිත සිසුවාගේ බෑගය තුළින් හමු වූ දුම්කුඩු පැකට්ටුව ඔහුගේ නොවන බව ඉතා පැහැදිලිව සඳහන්ව තිබියදීත් වගඋත්තරකාර විදුහල්පතිනිය හා පාසල් විනය කමිටුව විසින් වින්දිත සිසුවා නොකළ වරදකට ඔහුව වැරදිකරු කර සති දෙකක පන්ති උපදේශනයක් පැනවීම සඳහා යොමු කර ඇති බව නිරීක්ෂණය වේ. විදුහල්පතිනිය විසින් ඒ සම්බන්ධව කරුණු දක්වමින් ප්‍රකාශ කොට ඇත්තේ එම පන්ති උපදේශනය කිසිසේත්ම දඬුවමක් නොවන බවත් දරුවා යහමගට ගැනීමේ අරමුණින් සිදු කරන ලද උපදේශනාත්මක ක්‍රියාවලියක්

පමණක් වන බවත්ය. එසේ වුවද මෙම සිදුවීමේ වරද කවිෂ්ක අංජුල සිසුවා විසින් පිළිගෙන තිබියදීත් එවැනි පන්ති උපදේශනයක් සඳහා වින්දිත සිසුවා යොමු කිරීමට කටයුතු කිරීම වරදක් බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

තවද, සිද්ධිය සිදු වූ දින ඊට අදාළව විනයානුකූල පියවරක් වශයෙන්, 2024.09.12 දින සිට 2024.09.25 වන දින දක්වා වූ කාලසීමාව තුළ තම දරුවාගේ පාසල් පැමිණීම තාවකාලිකව අත්හිටුවීමට තීරණය කර ඇති බව විදුහල්පතිනිය විසින් එම අවස්ථාවේදී පැමිණිලිකාරියගේ සහෝදරිය (නැඟණිය) වෙත ප්‍රකාශ කර ඇති බවට, පැමිණිලිකාරිය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, වත්තල පොලිස් ස්ථානය සහ කලාප අධ්‍යාපන කාර්යාලය වෙත ලිඛිතව කරුණු ඉදිරිපත් කර ඇති ආකාරය නිරීක්ෂණය වේ. වින්දිත සිසුවා විසින් ද මෙම කොමිෂන් සභාව හමුවේ පෙනී සිටිමින් අදාළ කරුණු සනාථ කරමින් සාක්ෂි/ප්‍රකාශ ලබා දී ඇත. එමෙන්ම, 2024.09.12 දින සිට 2024.09.25 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ සත්සිදු ඉඳුරංග නැමැති සිසුවාගේ පන්ති තහනම් කිරීමට පියවර ගෙන තිබූ බවත්; අදාළ සිසුවා වත්තල පොලිස් ස්ථානය වෙත ගොස්, එහි මත්ද්‍රව්‍ය නිවාරණ ඒකකයේ නිලධාරීන් ද සමඟ ජීප් රථයකින් කැඳවාගෙන විත්, පොලිස් නිලධාරීන් විසින්ම සිසුවා පාසල් බලධාරීන් වෙත භාර දෙන්නේ නම් පමණක් ඔහුව නැවත පාසලට ඇතුළත් කර ගන්නා බවට විදුහල්පතිනිය තමා වෙත තරයේ ප්‍රකාශ කළ බවත්, සිද්ධිය සිදුවන අවස්ථාවේදී වින්දිත දරුවාගේ භාරකරු ලෙස කටයුතු කළ, වින්දිත සිසුවාගේ මවගේ සහෝදරිය වන හෙට්ටිආරච්චිලාගේ ඉෂාරා බුද්ධිකා ලෝගුස් යන අය විසින් විධිමත් දිවුරුම් ප්‍රකාශයක් මගින් මෙම කොමිෂන් සභාව වෙත සාක්ෂි සහාගත කරමින් කරුණු තහවුරු කර ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශය මගින් 2016.04.29 දිනැතිව නිකුත් කර ඇති 2012/16 චක්‍රලේඛනයෙහි 2.3.2 (vi) අනුව පාසල් සිසුවෙකු යම් තදබල විනය විරෝධී ක්‍රියාවක් සිදුකර ඇති විටකදී දෙමාපියන් භාරකරුවන් මෙන්ම අධ්‍යාපන බලධාරීන්ද දැනුම්වත් කර සති දෙකකට නොවැඩි කෙටි කාලීන පන්ති තහනමක් ක්‍රියාත්මක කළ යුතු බවට දක්වා ඇතත් වගඋත්තරකාර විදුහල්පතිනිය හා විනය මණ්ඩලය විසින් එම නීතිමය තත්වය අනුගමනය නොකර තම අභිමතය පරිදි වින්දිත සිසුවා සම්බන්ධව තීරණය කර පන්ති උපදේශනයකට යොමු කර ඇති බව නිරීක්ෂණය වේ.

- වින්දිත සිසුවාගේ බෑගය තුළ තිබී හමු වූවා යැයි කියන දුම්කුඩු පාර්සලය මත්ද්‍රව්‍ය පාර්සලයක් බව පාසලේදී තහවුරු කරගත් බවට 2024.09.19 දිනැති පාසැල් විනය කමිටු සටහන් පොතෙහි සටහන් කර ඇති අයුරු නිරීක්ෂණය වන අතර වගඋත්තරකාර විදුහල්පතිනිය ඒ සම්බන්ධයෙන් ප්‍රකාශ කොට ඇත්තේ මීට පෙර පාසල තුළ මත්ද්‍රව්‍ය සන්තකයේ තබාගෙන හසු වූ සිසුන් ලග තිබූ මත්ද්‍රව්‍ය වලට බොහෝ සෙයින් මෙම ද්‍රව්‍ය සමාන වීම නිසා හා විනය කමිටු සාමාජිකයන්ගේද ඒ සම්බන්ධ පෙර අද්දැකීම් මත පදනම්ව එසේ තීරණය කරන ලද වටය. නමුත් එවැනි තහවුරු කිරීමක් සිදු කිරීමට තරම් එම ක්ෂේත්‍රයේ විශේෂඥතාවයක් පාසලක විදුහල්පති හා ගුරුභවතුන් සතුව පවතීද යන්න මෙහිදී ගැටලු සහගත තත්වයකි. කෙසේවෙතත් වින්දිත සිසුවාගේ බෑගය තුළ තිබී හමු වූවා යැයි කියන එම දුම්කුඩු පාර්සලය මත්ද්‍රව්‍ය පාර්සලයක් ලෙස සඳහන් කරමින් විදුහල්පතිනිය විසින් පොලිස් ස්ථානය වෙත සන්නිවේදනය කර ඇති ආකාරයක් නිරීක්ෂණය වන අතර එය නිසි අවධානයකින් තොර අපරීක්ෂාකාරී වගකීම් විරහිත ක්‍රියාවක් ලෙස කොමිෂන් සභාවට පෙනී යයි. විශේෂයෙන්ම මෙම කොමිෂන් සභාව හමුවේ සිදු කරන ලද පරීක්ෂණ වලදී 3වන වගඋත්තරකාර වත්තල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් එම දුම්කුඩු පාර්සලය මත්ද්‍රව්‍ය නොවන බවට හඳුනාගෙන ඇති බවටද කරුණු දක්වා ඇත.

ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය තුළ ළමා අයිතිවාසිකම් සුරක්ෂිතභාවය උදෙසා සුවිශේෂී මෙන්ම දැඩි ව්‍යවස්ථාපිත නීතිමය රාමුවක් පවතින පසුබිමක සහ විධිමත් අධ්‍යාපනය ලබන සෑම දරුවෙකුටම සමාජයීය අභිමානයක්, ගරුත්වයක් මෙන්ම මූලික මානව අයිතිවාසිකම් හිමිවන බව ප්‍රායෝගිකව ආදර්ශයෙන්ම පෙන්වා දිය යුතු රජයේ වගකිවයුතු නිලධාරිනියක වශයෙන් වගඋත්තරකාර විදුහල්පතිනිය මෙම සිදුවීමේදී ක්‍රියා කර ඇති ආකාරය, සමස්ත පාසල් පද්ධතියක විදුහල්පති භූමිකාව සතු වෘත්තීය ආචාරධර්ම සහ සදාචාරාත්මක සුජාතභාවය පිළිබඳ ආයතනික සහ නීතිමය ප්‍රශ්නාර්ථයක් උද්ගත කරයි.

- 2026.05.21 වන දින මෙම කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණ අවස්ථාවේදී පළමු වගඋත්තරකාර විදුහල්පතිනිය විසින් ප්‍රකාශ කරන ලද්දේ පැමිණිල්ලට විෂයගත සිද්ධිය සිදු වූ 2024.09.12 දිනම චෝදනාවට ලක් වූ සත්සිදු ඉදුරංග සිසුවාද උප ප්‍රධාන ශිෂ්‍ය නායක එස්බෝන් සිසුවාද පාසල් බලධාරීන්ද කැඳවා තමා විසින් සිද්ධියට අදාළව මූලික විමර්ශනයක් සිදු කළ බවටය. එවැනි විමර්ශනයක් සම්බන්ධව පාසලේ කිසිදු ලේඛනයක සටහන් නොවීම සම්බන්ධව විමසීමේදී විදුහල්පතිය විසින් ප්‍රකාශ කරන ලද්දේ එවැනි කුඩා සිදුවීම් සම්බන්ධයෙන් සටහන් තැබීමක් සිදු නොකරන බවටය. විශේෂයෙන්ම 2024.09.12 දින සිදු වූ සත්සිදු ඉදුරංග සිසුවාගේ බෑගයෙන් මත්වන ද්‍රව්‍ය පාර්සලයක් හමු වූ බවට විදුහල්පතිනිය විසින් ප්‍රකාශ කරන ලද සිද්ධිය සම්බන්ධයෙන් විනය කමිටුව කැඳවා විමර්ශනයක් සිදු කර පාසලේ විනය කමිටු පොතෙහි සටහන් තබා ඇත්තේ 2024.09.19 දින බව ලේඛන අනුව නිරීක්ෂණය වේ.

  තවද වගඋත්තරකාර විදුහල්පතිනිය විසින් කරුණු දක්වා ඇත්තේ 2024.09.19 දින සිද්ධිය සම්බන්ධව විනය කමිටුව රැස් කර අදාළ සිසුන් ද කැඳවා විධිමත් විනය පරීක්ෂණයක් සිදු කිරීමේදී සත්සිදු ඉදුරංග සිසුවා ගෙන්වා ගැනීමට පන්ති භාර ගුරුවරිය මඟින් මවට දුරකථන ඇමතුමක් ලබා දෙන ලද නමුත් දරුවාගේ මව පැමිණීම ප්‍රතික්ෂේප කළ බවය. ඒ අනුව පැමිණි සිසුන්ගෙන් ලබා ගත් තොරතුරු පදනම් කරගෙන විනය කමිටුව විසින් සත්සිදු ඉදුරංග ශිෂ්‍යයා සති දෙකක උපදේශනයක් සඳහා යොමු කරන ලද බවත් ය. එම කරුණු පැමිණිලි පාර්ශවය ප්‍රතික්ෂේප කරන ලද අතර එහිදී පැමිණිලි පාර්ශවය කියා සිටින්නේ කිසිදු අවස්ථාවක එවැනි විමර්ශනයක් සඳහා තම පාර්ශවය කැඳවා නොමැති බවය. මේ අනුව පළමු වගඋත්තරකාර පාර්ශවය විසින් සිද්ධියට අදාළ පාර්ශවයන් කැඳවා විධිමත් පරිදි විමර්ශනයක් සිද්ධිය සම්බන්ධයෙන් සිදු කර නොමැති බවට ඉදිරිපත්ව ඇති කරුණු අනුව නිරීක්ෂණය වේ. තවද පාසල මඟින් මෙම සිදුවීම් සම්බන්ධව විධිමත් සහ පැහැදිලි ලෙස වාර්තා තබාගෙන නොමැති බවද පෙනී යයි.

- මෙම සිදුවීමට අදාළව වින්දිත සිසුවාට සහ ඔහුගේ මවට විදුහල්පතිනිය විසින් පාසලේදී බැන වැදුන බවට හා කුඩුකාරයන් ලෙසට අමතමින් අවමන්සහගත අයුරින් කටයුතු කළ බවට පැමිණිල්ලෙන් කරුණු දක්වා ඇත. එම කරුණු දැක්වීම අනුව 2024.09.13 වන දින පැමිණිලිකාරිය තම පුතා සමඟ විදුහලිපතිනිය හමුවීමට ගොස් ඇති අතර එහිදී වින්දිත සිසුවා මත්ද්‍රව්‍යයක් පාසල තුලට ගෙන ආ බවට විදුහල්පති විසින් ප්‍රකාශ කර ඇත. තවද එම අවස්ථාවේ විදුහල්පතිනිය විසින් **"තමුසේගේ පුතා මත්ද්‍රව්‍ය පාසලට ගෙනල්ලා ඒවා බොන කොට තමයි අහු වුනේ. තමුසේ දරුවා අතේ මත්ද්‍රව්‍ය එවලා ඒවා විකුණලා ද ජීවත් වෙන්නේ."** යැයි පවසමින් තමාට අවමන්සහගත අයුරින් බැන වැදුණු බවට පැමිණිලිකාරිය කරුණු දක්වා ඇත. එහිදි තම පුතාට විදුහල්පතිනිය විසින් **"කුඩ්ඩා"** යන නමින් ආමන්ත්‍රණය කරමින් අපහස කළ බවත් එම අවස්ථාවේ මේ පිලිබඳව සොයා බලා පාසල තුළ ගැටලුව විසඳන ලෙසත්, පොලිසිය වෙත ඉදිරිපත් නොකරන ලෙසත් පැමිණිලිකාරිය විසින්

විදුහල්පතිනියගෙන් ඉල්ලා සිටි නමුත් කිසිදු පරීක්ෂණයක් සිදු නොකොට පොලිසියට යන ලෙසට ලියුම ලබා දුන් බවටත් පැමිණිලිකාරිය කරුණු දක්වා ඇත. තවද එදින සිට 2024.09.25 වන දින වන තුරු තම දරුවා පාසලට නොඑවන ලෙසටත් 2024.09.25 දින පැවැත්වීමට නියමිත අපේ ප්‍රින්සිපල් (මත්ද්‍රව්‍ය සම්බන්ධ චිත්‍රපටයකි) නැමති චිත්‍රපටය නැරඹීමට භාරකරුවෙකු සමග පැමිණෙන ලෙසටත් විදුහල්පතිනිය විසින් ප්‍රකාශ කර ඇති බවටත් පැමිණිලිකාරිය විසින් කරුණු දක්වා ඇත.

පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කර ඇති උක්ත සිද්ධිය සිදු වන අවස්ථාවේ වින්දිත දරුවාගේ භාරකරු ලෙස කටයුතු කළ වින්දිත සිසුවාගේ මවගේ නැගණිය වන හෙට්ටිආරච්චිලාගේ ඉෂාරා බුද්ධිකා ලෝගුස් යන අය විසින් දිවුරුම් ප්‍රකාශයක් මඟින් මෙම කොමිෂන් සභාව වෙත කරුණු ඉදිරිපත් කර ඇත. සත්සිදු ඉදුරංග සිසුවා පාසලට "කුඩු" රැගෙනවිත් ඇති බවට පවසා පසුව එය දුම් කුඩු යනුවෙන් විදුහල්පතිනිය විසින් ප්‍රකාශ කළ බව හා විදුහල්පතිනිය විසින් ලිපියක් තමා හට ලබා දී එය රැගෙන තම අක්කාගේ පුතා වන සත්සිදු ඉදුරංග සමග වත්තල පොලිස් ස්ථානයට යන ලෙස තමාට අණකර සිටි බවටත් එහි දක්වා ඇත. තවද 2024.09.12 දින සිට 2024.09.25 දින දක්වා සත්සිදු ඉදුරංග දරුවාගේ පන්ති තහනම් කළ බවත්, සත්සිදු ඉදුරංග සිසුවා වත්තල පොලිස් ස්ථානයට ගොස් මත්ද්‍රව්‍ය නිවාරණ ඒකකයේ නිලධාරීන් සමඟ පොලිස් ජීප් රථයෙන් රැගෙනවිත් පොලිස් නිලධාරීන් විසින් සිසුවා පාසලට භාර දෙන්නේ නම් පමණක් ඔහුව පාසලට භාරගන්නා බවට විදුහල්පතිනිය විසින් තමාට තරයේ ප්‍රකාශ කළ බවටත් එම දිවුරුම් ප්‍රකාශය මඟින් කරුණු ඉදිරිපත් කර ඇත.

තවද වින්දිත සිසුවා හා ඔහුගේ මව මෙම කොමිෂන් සභාව වෙත, කලාප අධ්‍යාපන කාර්යාලය වෙත හා පොලිස් ස්ථානය වෙත ලබා දී ඇති ප්‍රකාශ මඟින්ද විදුහල්පතිතුමිය විසින් වින්දිත සිසුවාට හා ඔහුගේ මවට අවමන්සහගත අයුරින් කටයුතු කර ඇති බවට කරුණු ඉදිරිපත් කර ඇත. සිද්ධිය සිදු වූ මුල් අවස්ථාවේ සිටම වගඋත්තරකාර විදුහල්පතිතුමිය වින්දිත දරුවා මත්ද්‍රව්‍ය භාවිත කරන්නෙකු ලෙසට සළකා කටයුතු කිරීමෙන් හා සමස්ථයක් වශයෙන් ඇය විසින් මෙම සිදු වීමේදී ක්‍රියා කර ඇති ආකාරය අනුව ඇය විසින් වින්දිත දරුවා කෙරෙහි අවමන්සහගත අයුරින් කටයුතු කර ඇති බවක් පෙනී යයි.

- පැමිණිලිකාරිය වන වින්දිත සිසුවාගේ මව විසින් මෙම සිද්ධියට අදාළව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද පැමිණිල්ල, කලාප අධ්‍යාපන කාර්යාලය සහ අදාළ පොලිස් ස්ථානය වෙත යොමු කරන ලද පැමිණිලිවල සඳහන් කරුණු ප්‍රකාරවද, වින්දිත ශිෂ්‍යයා විසින් 2025.04.04 දින මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ලබා දුන් ප්‍රකාශය අනුවද, වින්දිත ශිෂ්‍යයාගේ බෑගය තුළට ප්‍රශ්නගත දුම්කුඩු පාර්සලය ඇතුළත් කර ඇත්තේ එම විද්‍යාලයේ උප ප්‍රධාන ශිෂ්‍ය නායකයා වන එස්බෝන් ට්‍රෙවෝ නැමැති ශිෂ්‍යයා බවට චෝදනා නඟා ඇත.

එහිදී පැමිණිලිකාරිය වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, කවිෂ්ක අංජුල නැමැති ශිෂ්‍යයාගේ සමීපතමයෙකු මෙන්ම තම ඥාති පුත්‍රයෙකුද වන සිතුම් අරුෂ නැමැති ආදි ශිෂ්‍යයා මාර්ගයෙන්, උසස් පෙළ පන්තියේ ඉගෙනුම ලැබූ කවිෂ්ක අංජුල නැමැති ශිෂ්‍යයා WhatsApp සන්නිවේදන යෙදුම ඔස්සේ දුරකථනයෙන් සම්බන්ධ කරගෙන ඒ අනුව, තම පුත්‍රයාගේ බෑගයට අදාළ දුම්කුඩු ඇතුළත් කරනු ලැබුවේ 'එස්බෝන්' නැමැති උප ප්‍රධාන ශිෂ්‍ය නායකයා බවට අංජුල ශිෂ්‍යයාගේ ප්‍රකාශය මඟින් තහවුරු කරගත් බවත්, එම දුරකථන සංවාදය තමා විසින් ශ්‍රව්‍ය පටිගත කිරීමකට (Audio Recording) ලක් කළ බවත්ය. පැමිණිලි පාර්ශවය විසින් එම පටිගත කිරීම් ඇතුළත් සීඩී (CD) පටය කොමිෂන් සභාව වෙත සාක්ෂි වශයෙන් ඉදිරිපත් කර ඇති අතර, එහි එවැනි සංවාදයක් ඇතුළත් බව නිරීක්ෂණය වුවද, ඊට අදාළ විද්‍යාත්මක තහවුරු කිරීමක් සිදු කර නොමැති බැවින්, එම සාක්ෂියේ විශ්වසනීයත්වය

සහ සත්‍යතාවය පිළිබඳව අවසානාත්මක නිගමනයකට එළඹීමට කොමිෂන් සභාවට නෛතික හැකියාවක් නොමැත.

තවද වින්දිත සිසුවා වන සත්සිදු ඉදුරංග ප්‍රකාශ කර ඇත්තේ තම බෑගයට මත්කුඩු පාර්සලය එස්බෝන් නමැති උප ප්‍රධාන ශිෂ්‍ය නායකයා විසින් දැමූ බව තමා දුටු බවත් ඔහු අංජුල නමැති සිසුවා සමග කතා කරමින් එම අවාස්ථාවේ බෑග් පරීක්ෂා කිරීම සිදු කරන ලද බවටත්ය. එහෙත් කවිෂ්ක අංජුල නමැති සිසුවා විදුහල්පති වෙත ඉදිරිපත් කරන ලද 2024.09.19 දිනැති ලිපියේ ඔහු විසින් ප්‍රකාශ කර ඇත්තේ " ***සිද්ධිය වෙලා දවස් දෙකකට පස්සේ සිතුම් කියලා මගේ යාලුවෙක් මට කෝල් කළා. එයා මගෙන් ඇහුව උඹ නේද ඕක දැම්මේ කියලා. මාව සිතුම් බය කරා උඹ ඕක දාලා තිබුණොත් පාරෙදි අල්ලන් ගහනවා කියලා. ඒක නිසා මම සිතුම්ට කිව්වා දුම් කුඩු පැකට් එකක් දාන්න කියලා දුන්නේ එස්බෝන් කියන ශිෂ්‍ය නායකයට කියලා. මම ඒක කිව්වේ සිතුම් මාව බය කරපු නිසා. මේ සිද්ධියට ශිෂ්‍ය නායකයන් සම්බන්ධ නෑ.*** " යනුවෙන් ය. කවිෂ්ක අංජුල නමැති සිසුවාගේ මෙම ප්‍රකාශය මත සත්සිදු ඉදුරංග සිසුවාගේ බෑගයට දුම්කුඩු පාර්සලය දමනු ලැබුවේ එස්බෝන් නමැති උප ප්‍රධාන ශිෂ්‍යා බවට පැමිණිල්ලි පාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද කරුණු තහවුරු වීමක් සිදු නොවේ. තවද එවැනි තහවුරු කිරීමක් සිදු කෙරෙන වෙනත් කිසිදු සාක්ෂියක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත්ව නොමැත.

- පැමිණිලි පාර්ශවයේ කරුණු දැක්වීම අනුව ප්‍රස්තුත සිද්ධිය සිදු වූ 2024.09.12 වන දිනම සත්සිදු ඉදුරංග සිසුවා මත්ද්‍රව්‍ය පාසලට රැගෙන එන බවට සහ පාසල තුළ මත්ද්‍රව්‍ය භාවිත කරන බවට සාක්ෂි ලැබී ඇති බව සඳහන් කරමින් විදුහල්පතිනිය විසින් වත්තල පොලිසියේ ස්ථානාධිපති අමතන ලද 2024.09.12 දිනැති ලිපිය වින්දිත දරුවාගේ පුංචි අම්මා නමැත්තිය වෙත ලබා දී වත්තල පොලිස් ස්ථානයට යොමු වන ලෙස දැනුම් දී ඇත. එහෙත් එදින පොලිස් ස්ථානයට නොගොස් 2024.09.13 වන දින තම පුතාද කැටුව වත්තල පොලිස් ස්ථානය වෙත ගොස් එම ලිපිය ස්ථානාධිපතිවරයාට ඉදිරිපත් කරන ලද බවට පැමිණිලිකාරිය විසින්ද කරුණු ඉදිරිපත් කර ඇත. තවද සිද්ධිය සබැඳිව එවැනි අන්තර්ගතයකින් යුතු ලිපියක් ද සමගින් අගතියට පත් ශිෂ්‍යයා සහ ඔහුගේ භාරකරු වත්තල පොලිස් ස්ථානය වෙත යොමු කළ බව වගඋත්තරකාර විදුහල්පතිනිය විසින් ද අවිවාදිතව පිළිගෙන තිබේ. එහෙත් කොමිෂන් සභාව විසින් සිද්ධියට අදාළව වත්තල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිගෙන් වාර්තාවක් කැඳවා ඇති අතර 2025.01.09 දිනැති එම වාර්තාවේ සඳහන් කර ඇත්තේ මෙම පැමිණිල්ලේ වින්දිත දරුවාගේ මව විසින් දරුවාට පාසල තුළ දී සිදු වූ අපහාසයක් සම්බන්ධයෙන් සී.අයි.බී.105/183 යටතේ 2024.09.18 දින ගොනු කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් පමණක් වන අතර විදුහල්පතිනිය විසින් යොමු කරනු ලැබූ 2024.09.12 දිනැති ලිපිය මඟින් ඉදිරිපත් කරන ලද පැමිණිල්ල පිළිබඳව විමර්ශන කටයුතු කර ඇති බවක් සඳහන් නොකරයි. එහිදී ස්ථානාධිපතිතුමා විසින් කොමිෂන් සභාව වෙත දන්වා ඇත්තේ වත්තල ශාන්ත අන්තෝනි විද්‍යාලයේ විදුහල්පති විසින් සත්සිදු ඉදුරංග නම් සිසුවා මත්ද්‍රව්‍ය පාසල තුළට රැගෙන එන සහ මත්ද්‍රව්‍ය භාවිත කරන බවට සඳහන් කරමින් යොමු කරනු ලැබූ 2024.09.12 දිනැති ලිපියක් තමා වෙත නොලැබී ඇති බවය. තවදුරටත් ස්ථානාධිපතිවරයා සඳහන් කර ඇත්තේ මෙම පැමිණිල්ලේ පැමිණිලිකාරිය විසින් සිදු කළ පැමිණිල්ල පාසලේ විදුහල්පතිට එරෙහිව සිදු කරන ලද පැමිණිල්ලක් බැවින් ඒ සම්බන්ධව විමර්ශන කළ යුත්තේ කලාප අධ්‍යාපන කාර්යාලය විසින් බැවින් මහර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලිපියකින් ඒ බව යොමු කරන ලද බවය.

කෙසේ වෙතත්, 2024.09.16 වන දින පෙ.ව. 10.05 ට පමණ අදාළ පැමිණිල්ල විභාග කිරීම සඳහා කවිෂ්ක අංජුල නැමැති ශිෂ්‍යයා සිය මව සමඟ වත්තල පොලිස් ස්ථානයේ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපතිවරයාගේ කාර්යාලය අසල රැඳී සිටින අයුරු දැක්වෙන ඡායාරූපමය සාක්ෂි පැමිණිලි

පාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. තත්කාලීනව, අදාළ විද්‍යාලයේ විනය කමිටු වාර්තා පොත ප්‍රකාරවද, මෙම සිදුවීම සම්බන්ධයෙන් වත්තල පොලිස් ස්ථානය මඟින් විමර්ශන කටයුතු දියත් කර ඇති බවට කරුණු අනාවරණය වන අතර, ඒ සම්බන්ධයෙන් 2024.09.19 දිනැතිව පාසල් විනය කමිටු වාර්තා පොතෙහි සටහන් තබා ඇති බව නිරීක්ෂණය වේ. එම සටහන්වල ප්‍රකාශිතව දක්වා ඇත්තේ: "පොලිස් ස්ථානයේදී අනාවරණය වූ තොරතුරුවලට අනුව එම පාර්සලය සත්සිදු ඉඳුරංග සිසුවාගේ බෑගයට දමා ඇත්තේ 12 ශ්‍රේණියේ ඉගෙනුම ලබන අංජුල සිසුවා බව ප්‍රකාශ කර ඔහුව පාසලට යොමු කරන ලද බවට"ය.

තවද පැමිණිල්ලට අදාළව 2026.01.26 වන දින මෙම කොමිෂන් සභාව හමුවේ සිදු කරන ලද පරීක්ෂණය අවස්ථාවේ දී ද වත්තල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වෙනුවෙන් පෙනී සිටි පො.සැ. ඩබ්.එම්.ඩී.එල්.ජයසිංහ නිලධාරියා විසින් කරුණු දක්වා ඇත්තේ මෙම පැමිණිල්ලට අදාළ කාරණය සම්බන්ධයෙන් එහි පාර්ශවකරුවන් කැඳවා එවකට ස්ථානාධිපතිවරයා විසින් විමර්ශන කටයුතු පවත්වා ඇති බවටය. තවද එම සිදුවීම සම්බන්ධව වැඩිදුර පරීක්ෂණ ස්ථානයේ එවකට දූෂණ මර්ධන ඒකකයේ රාජකාරී කළ පොලිස් පරීක්ෂක හේරත් නිලධාරීයා විසින් සිදු කර ඇති බවත් එම ප්‍රශ්නගත කුඩු පාර්සලය මත්ද්‍රව්‍ය නොවන බවට තහවුරු කරගෙන ඇති බවත්, එම කුඩු පාර්සලය පාසල තුළට රැගෙනවිත් ඇත්තේ වෙනත් සිසුවෙකු බවට අනාවරණය කරගෙන ඇති බවටත් එම නිලධාරියා විසින් කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කොට ඇත.

මෙකී සියලු කරුණු අනුව අනාවරණය වන්නේ වත්තල ශාන්ත අන්තෝනි විද්‍යාලයේ විදුහල්පති විසින් සත්සිදු ඉඳුරංග නම් සිසුවා මත්ද්‍රව්‍ය පාසල තුළට රැගෙන එන සහ මත්ද්‍රව්‍ය භාවිත කරන බවට සඳහන් කරමින් වත්ත පොලිසියේ ස්ථානාධිපති වෙත යොමු කරනු ලැබූ 2024.09.12 දිනැති ලිපිය මත පදනම්ව වත්තල පොලිස් ස්ථානය විසින් මෙම සිද්ධියට අදාළව විමර්ශන කටයුතු 2024.09.13 වන දින සිට 2024.09.14,16 යන දිනයන් කිහිපයකදී සිදු කර ඇති බවටය. නමුත් එම විමර්ශන සම්බන්ධයෙන් කිසිදු ප්‍රකාශයක් හෝ සටහනක් පොලිස් ස්ථානයේ කිසිදු ලේඛනයක සඳහන් නොවන බව මෙම කොමිෂන් සභාව හමුවේ සිදු කළ පරීක්ෂණ අනුව අනාවරණය විය. තවද 2024.09.13 වන දින සිට 2024.09.14,16 යන දිනයන්හිදී පොලිස් ස්ථානය තුළ මෙම සිදුවීමට අදාළව සිදු කරන ලද විමර්ශන සම්බන්ධයෙන් කිසිවක් එවකට ස්ථානාධිපති විසින් මෙම කොමිෂන් සභාව වෙත වාර්තා කර නොමැත. මෙම සිදුවීම්වලට පසුව 2024.09.18 වන දින පැමිණිලි පාර්ශවය විසින් තම පුතාට පාසලෙන් සිදුවූ අපහාසයක් සම්බන්ධයෙන් සී අයි බී (1) 05/183 යටතේ සිදු කළ පැමිණිල්ල සම්බන්ධයෙන් පමණක් ස්ථානයේ සටහන් තබා ඇති බවද නිරීක්ෂණය වූ අතර ඒ සම්බන්ධව පමණක් මෙම කොමිෂන් සභාව වෙත කරුණු වාර්තා කර ඇති බවද නිරීක්ෂණය වේ.

එසේ නමුදු, වත්තල පොලිස් ස්ථානයට අනුයුක්ත අදාළ නිලධාරීන් 2026.06.25 දින මෙම කොමිෂන් සභාව හමුවට කැඳවා සිදු කරනු ලැබූ විමර්ශනයන්හිදී ප්‍රස්තුත කරුණ සම්බන්ධයෙන් කරුණු විමසීමේදී එකී නිලධාරීන් විසින් ප්‍රකාශ කර සිටියේ; පාසල් වයසේ පසුවන බාලවයස්කරුවන්ගේ නාමයන් පොලිස් නිල ලේඛනගත කළහොත් එය එම දරුවන්ගේ අනාගත අභිවෘද්ධියට අහිතකර බලපෑමක් එල්ල කළ හැකි හෙයින්, දෙමාපියන්ගේ සහ ගුරුභවතුන්ගේ ඉල්ලීම් මත පදනම්ව බොහෝ අවස්ථාවන්හිදී අදාළ පාර්ශවකරුවන් කැඳවා වාචිකව අවවාද කොට එකී ගැටලු සමථයකට පත් කිරීමට පියවර ගන්නා බවත්, ප්‍රස්තුත සිද්ධියේදී ද එකී ක්‍රියාපටිපාටියම අනුගමනය කළා විය හැකි බවත්ය. තවද, පැමිණිලිකාර පාර්ශවය ද සිය කරුණු දැක්වීම් මඟින් එකී ක්‍රියාපටිපාටිය අනුමත කරමින්, වත්තල පොලිස් ස්ථානයේ නිලධාරීන්ගේ මැදිහත්වීම යුක්තිසහගත සහ සාධාරණ එකක් වූ බව තහවුරු කර ඇත. කෙසේ වුවද 2024.09.13 වන දින සිට 2024.09.14,16 යන දිනයන්හිදී පොලිස්

ස්ථානය තුළ මෙම සිදුවීමට අදාළව සිදු කරන ලද විමර්ශන සම්බන්ධයෙන් කිසිවක් එවකට ස්ථානාධිපති විසින් මෙම කොමිෂන් සභාව වෙත වාර්තා කර නොමැති වීම යන්න ගැටලු සහගත කරුණක් බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

- වින්දිත සිසුවාගේ මව විසින් 2025.01.09 දින දරුවාව වත්තල ශාන්ත අන්තෝනි විද්‍යාලයෙන් ඉවත් කරගෙන 2025.01.16 දින කොටහේනේ ශාන්ත ලුසියා විද්‍යාලයට ඇතුලත් කර මේ වන විට එම පාසලේ අධ්‍යාපන කටයුතු සිදු කරන බවට පැමිණිලි පාර්ශවය වෙතින් කරුණු ඉදිරිපත්ව ඇත.

**නිගමනය**

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් 1989 නොවැම්බර් මස 20 වන දින සම්මත කර ගන්නා ලද ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියට (Convention on the Rights of the Child) පාර්ශවකරුවෙකු ලෙස ශ්‍රී ලංකාව 1991 වසරේදී අත්සන් තබා ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට නෛතිකමය වශයෙන් බැඳී සිටී. එකී ළමා අයිතිවාසිකම් සම්මුතියේ 37 වන වගන්තියෙහි, " රාජ්‍ය පාර්ශවයන් සහතික කළ යුත්තේ: (අ) කිසිම දරුවෙකු වධහිංසාවට හෝ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමන්සහගත සැලකිලි හෝ දඬුවම් වලට ලක් නොකළ යුතුය " යනුවෙන් සඳහන් කර තිබේ. මීට අමතරව සියලු වැදගත් අන්තර් ජාතික මානව හිමිකම් ප්‍රකාශනයන් වධ හිංසාව, කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලක් හෝ දඬුවමක් තහනම් කරයි. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 5 වාවස්ථාව, සිවිල් සහ දේශපාලනික අයිතීන් පිළිබඳ අන්තර් ජාතික සම්මුතියේ 7 ව්‍යවස්ථාව, වධහිංසාව සහ වෙනත් කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලකට හෝ දඬුවමකට එරෙහි 7 සම්මුතියේ 1 වන ව්‍යවස්ථාව මීට සමාන වගන්ති වේ.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව ප්‍රකාරව " කිසිම තැනැත්තෙකු වදහිංසාවට, කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය. " යන්න අනුල්ලංඝනීය අයිතිවාසිකමක් ලෙස සහතික කොට ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අමතරව 1994 අංක 22 දරන වදහිංසා සහ වෙනත් කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකීමට ලක්වීමට එරෙහි සම්මුති පනත මගින් දඬුවම් ආකාර වධහිංසා හෝ පුද්ගලයින්ව කෲර අමානුෂික සහ අවමන් සහගත සැළකිල්ලකට හෝ දඬුවමකට ලක් කිරීම තහනම් කරයි.

එවන් වූ පසුබිමක මෙකී පැමිණිල්ලෙන් අගතියට පත්ව ඇත්තේ වයස අවුරුදු 14ක් වූ, 10 වන ශ්‍රේණියේ අධ්‍යාපනය ලබමින් සිටි බාලවයස්කාර පාසල් සිසුවෙකු වේ. වගඋත්තරකාර පාර්ශවය පාසල් සිසුන් අතර උග්‍ර ලෙස ව්‍යාප්තව පවතින මත් උවදුර පාසල් පරිශ්‍රය තුළින් තුරන් කිරීමේ සත්භාවීය චේතනාවෙන් ක්‍රියා කරන බව පෙනී යන නමුත්, මෙම සිදුවීමේදී වගඋත්තරකාර පාර්ශවය වින්දිත සිසුවා සම්බන්ධයෙන් අනුගමනය කර ඇති ක්‍රමවේදය ගැටලුසහගත වන බව පෙනී යයි. වගඋත්තරකාර විදුහල්පතිනිය විසින් සිද්ධිය සිදු වූ මුල් අවස්ථාවේදීම ඒ පිළිබඳව ප්‍රත්‍යක්ෂ සාක්ෂි මත පදනම්ව නිසි විමර්ශනයක් මඟින් තීරණය කිරීමකින් තොරව වින්දිත සිසුවා පාසල තුළට මත්ද්‍රව්‍ය රැගෙන එන බවට හා පාසල තුළ මත්ද්‍රව්‍ය භාවිත කරන බවට සාක්ෂි ලැබී ඇති බව සඳහන් කරමින් ඒ පිළිබඳ පොලිසියේ අවධානය යොමු කරන ලෙසට දන්වමින් වත්තල පොලිසියේ ස්ථානාධිපති අමතන ලද 2024.09.12 දිනැති ලිපිය සහිතව වින්දිත සිසුවා පොලිස් ස්ථානය වෙත යොමු කිරීමට කටයුතු කිරීම අත්තනෝමතික ක්‍රියාවක් ලෙස කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

තවද වින්දිත සිසුවාගේ බෑගයට දුම්කුඩු ලෙස හඳුන්වන පාර්සලයක් දමා අභූත චෝදනාවකට ලක් කිරීමේ වරද, ආර්.එම්.කවිෂ්ක අංජුල නමැති සිසුවා විසින් පිළිගෙන ඒ බව ලිඛිත පාපොච්චාරණයකින් 2024.09.19 වන දින විදුහල්පතිනිය වෙත ලබා දී තිබියදීත්, එදිනම (එනම් සිද්ධිය සිදු වී දින 7ක කාලයකට පසු) පාසලේ විනය කමිටුව රැස්කරවා නිර්දෝෂී වූ පාසල් සිසුවෙකු වැරදිකරුවෙකු වශයෙන් තීරණය කරමින් සති දෙකක කාලසීමාවක් සඳහා වින්දිත සිසුවා පන්ති උපදේශනයකට යොමු කිරීමට කටයුතු කිරීමත් හා විදුහල්පතිනිය සිද්ධිය සිදු වූ මුල් අවස්ථාවේ සිටම වින්දිත සිසුවා මත්ද්‍රව්‍ය භාවිත කරන්නනෙකු ලෙස සළකා කටයුතු කිරීමත් යන පළමු වගඋත්තරකාර පාර්ශවයේ ක්‍රියාකලාපයන් මත වින්දිත සිසුවා මානසිකව මෙන්ම සමාජයීය වශයෙන් අවමන් සහගත සැලකීමකට භාජනය කර ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

මෙකී සියලු කාරණා තුළින් වගඋත්තරකාර විදුහල්පතිනිය හා විනය මණ්ඩලය දරුවන් සම්බන්ධව ඇති නීති රීති ජාත්‍යන්තර ප්‍රඥප්ති හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ද උල්ලංඝනය කරමින් අධ්‍යාපනය ලබන සෑම දරුවෙක්ටම සමාජ ගරුත්වයක් සහ අයිතිවාසිකම් පවතී යන්න නොසළකා කටයුතුකර වින්දිත දරුවා අවමන් සහගත සැලකිල්ලකට භාජනය කර ඇති බවට කරුණු නිරීක්ෂණය වේ. ඒ තුළින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවේ එන "කිසිම තැනැත්තෙකු වධ හිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ **අවමන් සහගත සැලකිල්ලකට** නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය." යන වින්දිත දරුවාගේ මූලික අයිතිවාසිකම වගඋත්තරකාර විදුහල්පති හා විනය කමිටුව විසින් කඩ කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ. ඒ අනුව මින් ඉදිරියට දරුවන් මුහුණපාන මෙවැනි ගැටලු සහගත තත්ත්වයන් පාසල් පද්ධතිය තුළ උද්ගත වන සෑම අවස්ථාවකදීම, ඒ පිළිබඳව විධිමත් විමර්ශනයක් සිදුකොට නිවැරදි තීරණවලට එළඹිය යුතු බවත්, එකී ගැටලුවලට අදාළ සනාථකරණ සාක්ෂි නිසි පරිදි ලේඛනගත කොට සුරක්ෂිතව තබාගත යුතු බවත්, නිවැරදි තොරතුරු හා දත්ත සහිතව අදාළ ආයතන වෙත සිසුන් යොමු කිරීමට පියවර ගැනීම අත්‍යවශ්‍ය කරුණක් බවත් කොමිෂන් සභාව විසින් අවධාරණය කරනු ලබයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විවිධ ආකෘතීන් විශ්ලේෂණය කර බලන කල්හි <u>*Silva v Chairman, Fertilizer Corporation (1989)*</u> 2 SLR 393 හිදී අමරසිංහ විනිසුරු ඔහු විසින් වෙනම කරන ලද තීරණයේ " 11 ව්‍යවස්ථාව විසින් අරමුණු කරන ලද සැළකිල්ල හුදෙක් ශාරීරික ප්‍රචණ්ඩත්වයට සීමා නොවිය. එමගින් ආත්මය සහ මනස යන විෂය පථය ද අදාළ කරගනියි. "එමඟින් අමානුෂික සැළකිල්ලට ලක් නොවීමේ අයිතිය සම්බන්ධයෙන් ශාරීරික ප්‍රචණ්ඩත්වය ඉක්මවා යන භාවාත්මක හානිය සම්බන්ධයෙන් ද පුළුල් අර්ථ කථනයක් ලබා දී ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SC/FR/97/2017 <u>*හේවාමද්දුමගේ කරුණාපාල සහ තවත් අය එදිරිව ජයන්ත ප්‍රේමකුමාර සිරිවර්ධන සහ තවත් අය*</u> නඩු තීන්දුවෙහිදී සෑම ශාරීරික දඬුවමක්ම වධ හිංසනයක් ලෙස ගිණිය නොහැකි වුව ද දරුවකුට නෛසර්ගිකව හිමිව ඇති ආත්ම ගරුත්වය නොසලකා හරිමින් කායික හෝ මානසික දඬුවමක් පනවන බව පෙනී යන්නේ නම් එය අමානුෂික සහ පහත් කොට සැලකීමේ දඬුවමක් හැටියට සැලකිය හැකි බවට ප්‍රකාශයට පත් කළේ ය. වැඩිහිටියකුට එරෙහිව තවත් වැඩිහිටියකු වධ හිංසනයක් කළහොත් හිංසනයට ලක් වූ වැඩිහිටියාට ඊට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගත හැකි වුව ද ළමයකු සම්බන්ධ තත්වය ඊට වෙනස් ය. නිවෙසේ දී හා පාසලේ දී නිවැරැදි මාර්ගයට ගැනීමේ චේතනාවෙන් ළමයකුට දඬුවම් පැමිණවීම සිදු වන අතර ළමයා අවදානමට ලක් කළ හැකි කාණ්ඩයට අයත් හෙයින් ළමයාට ඉහළ සමාජ රැකවරණයක් දිය යුතුය යන්න මෙම නඩු තීන්දුවේ ප්‍රධාන අවධාරණයකි.

එසේම ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SC/FR/677/2012 ලන්දගේ ඉෂාරා අංජලී එදිරිව වරුණි බෝගහවත්ත නඩු තීන්දුව අනුව වැඩිහිටියන්ට පවත්නා වූ සියලුම මානව හිමිකම් සහතිකයන්ගේ දරුවන්ටද හිමිවිය යුතු බවත් ඊට අමතරව දරුවන්ගේ ගරුත්වය සහ වටිනාකම් ප්‍රවර්ධනය වන ආකාරයටත් ; ඔවුන්ව සමාජානුගත වීම පහසු කෙරෙන ආකාරයටත්; දරුවාගේ උපරිම යහපත පිළිඹිඹු වන ආකාරයටත් ; සහ එම වයසේ පුද්ගලයෙකුගේ අවශ්‍යතාවයන් සැළකිල්ලට ගැනෙන ආකාරයටත් ඔවුන්ට සැලකිය යුතුය යනුවෙන් අවධාරණය කරයි. තවද වැඩිහිටියෙකුට අදාළ වන "ඉහළ මට්ටමක හිංසාවක්" යන්න සෑම අවස්ථාවකම බාලවයස්කරුවෙකුගේ මානසික මට්ටම සම්බන්ධයෙන් එකම ආකාරයෙන් අදාළ නොවන බව හඳුනා ගන්නා බවත් එම නිසා බාලවයස්කරුවෙකු විසින් අවමන් සහගත සැළකිල්ලක් සම්බන්ධයෙන් පැමිණිලි කරන අවස්ථාවක, ඉහළ භාරකරු වන අධිකරණය විසින්, එම ඉල්ලීම් ඉහළ මට්ටමක හිංසාවකට සමාන වීමට අසමත් වූ පමණින් ඉවත නොදැමිය යුතුය. ඒ වෙනුවට, චෝදනාවට ලක්වූ සැළකිල්ල මගින් එම දරුවාගේ මානසික තත්වයට සහ වර්ධනයට සිදු වූ බලපෑම සම්බන්ධයෙන් ප්‍රවේශම් සහගත ලෙස සළකා බැලිය යුතු බව එකී ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව මඟින් අවධාරණය කර ඇත.

යම් සිසුවෙකුගේ හැසිරීම පාසලට නොගැලපෙන හැසිරීමක් ලෙස පෙන්නුම් කරන්නේ නම් ඒ සම්බන්ධව ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති 12/2016 හා 11/2026 චක්‍රලේඛනයන් මඟින් ප්‍රතිපාදන සලසා ඇති අතර එම චක්‍රලේඛනයෙහි 2.3.2 (vi) අනුව පාසල් සිසුවෙකු යම් තදබල විනය විරෝධී ක්‍රියාවක් සිදුකර ඇති විටකදී දෙමාපියන් භාරකරුවන් මෙන්ම අධ්‍යාපන බලධාරීන්ද දැනුවත් කර සති දෙකකට නොවැඩි කෙටි කාලීන පන්ති තහනමක් ක්‍රියාත්මක කළ යුතු බවට දක්වා ඇත. මෙම සිදුවීමේදී වගඋත්තරකාර විදුහල්පතිනිය සහ විනය මණ්ඩලය එකී නෛතික ප්‍රතිපාදනවලට අනුගත නොවී, ස්වකීය අභිමතය පරිදි වින්දිත ශිෂ්‍යයා සම්බන්ධයෙන් තීරණ ගෙන ඇත. තවද, සමාන වැරදි සිදුකළ අනෙකුත් ශිෂ්‍යයන් උදෙසා අනුගමනය කළ ක්‍රියාපටිපාටියට සපුරා වෙනස්ව යමින් වින්දිත සිසුවා සම්බන්ධයෙන් අසමාන හා විෂම සැලකීමකින් ඔවුන් කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

තවද එම තත්වය තුළ අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති 2012/37 චක්‍රලේඛනයෙහි 5.2 (අ) වගන්තියෙහි එන පාසල් ශිෂ්‍යයන් සම්බන්ධයෙන් ගුරුවරයා ශිෂ්‍යයින්ගේ ස්ථානීය දෙමාපියන් නම් වූ නීතිමය සංකල්පය සැලකිල්ලට ගෙන සෑම විටම දෙමාපියන් හා දරුවන් තමා වෙත තබා ඇති විශ්වාසය ආරක්ෂා කිරීම හා දෙමාපිය භාරකරුවන් කෙරෙහි දරුවන්ගේ විශ්වසනීයත්වය තහවුරු වන ආකාරයට කටයුතු කළ යුතුය යන නීතිමය තත්වය පළමුවන වගඋත්තරකාර පාර්ශවය විසින් වින්දිත සිසුවා සහ ඔහුගේ භාරකරුවන් සම්බන්ධව කටයුතු කිරීමේදී අභිබවනය කර ඇති බවද නිරීක්ෂණය වේ.

මේ තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට ඇති නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුතු බවට වූ වින්දිත පාසල් සිසුවාගේ මූලික අයිතිවාසිකමද 1වන වගඋත්තරකාර වත්තල ශාන්ත අන්තොනි විද්‍යාලයේ විදුහල්පති හා විනය කමිටුව විසින් උල්ලංඝනය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

ඒ අනුව පහත සඳහන් නිර්දේශ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබේ.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින්,

1. මෙම සිදුවීමට අදාළව, වගඋත්තරකාර වත්තල ශාන්ත අන්තෝනි විද්‍යාලයේ විදුහල්පතිවරයා සහ විනය කමිටු සාමාජිකයින් ක්‍රියා කර ඇති ආකාරය සම්බන්ධයෙන් විධිමත් විමර්ශනයක් පවත්වා ඔවුන් සම්බන්ධව සුදුසු විනයානුකූල පියවර ගත යුතුය.

2. පාසල් පද්ධතිය තුළ ළමුන් සම්බන්ධයෙන් පැනනගින මෙවැනි ගැටලුකාරී අවස්ථාවන්හිදී, නිවැරදිව කරුණු විමසා තීරණ ගත යුතු අතර; ඊට අදාළ ප්‍රමාණවත් සාක්ෂි නිසි පරිදි ගොනු කර නිවැරදි තොරතුරු සමඟ අදාළ බලධාරී ආයතන වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුය. තවද, මෙවැනි සිදුවීම් සම්බන්ධයෙන් පාසල තුළ කඩිනම් අභ්‍යන්තර පරීක්ෂණ පැවැත්වීමේ අත්‍යවශ්‍යතාවය සහ ඒ පිළිබඳ විධිමත්, පැහැදිලි හා නිල වාර්තා පවත්වාගෙන යාම අනිවාර්ය බවට සියලුම විදුහල්පතිවරුන් වෙත උපදෙස් නිකුත් කළ යුතුය.

2026. 08 . 28 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත මෙයින් දන්වා සිටිමු.

**එල්.ටී.බී. දෙහිදෙණිය,**
**ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු),**
**සභාපති,**
**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.**

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**නිමල් ජී. පුංචිහේවා,**
**කොමසාරිස්,**
**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.**

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :

1) ලේකම් - අ.ක.ස
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල.

2) අධ්‍යාපන අමාත්‍ය
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල.